වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

# Annual Report

2021



සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

கட்புல அரங்கக் கலைப் பல்கலைக்கழகம்

**University of the Visual and Performing Arts**

## දැක්ම

"දෘශ්‍ය සහ රංගකලාවන්හි විවිධ සම්ප්‍රදායයන් සහ ප්‍රවනතා පිළිගනිමින් සංස්කෘතිය, සෞන්දර්යය, නිර්මාණශීලීබව සහ විනෝදාස්වාදය යන අංශයන්ගේ මානව අත්දැකීම්වල දැනුම වැඩි දියුණු කිරීමේ සහ පිරිපහදු කිරීමේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ විශ්වවිද්‍යාලය බවට පත්වීම."

## මෙහෙවර

"දෘශ්‍ය සහ සෞන්දර්ය කලා ක්ෂේත්‍රයන්හි හා දෘශ්‍ය කලා පර්යේෂණයෙහි දැනුම හා අධ්‍යාපනය ලද, නුවණැති නිර්මාණශීලි පුරවැසියන් බිහි කිරීම."

ශ්‍රී ලංකාවේ සහ ගෝලීය ප්‍රජාවේ සමාජ හා සංස්කෘතික අවශ්‍යතාවන්ට දායකත්වය දෙමින් මානවවාදී අධ්‍යාපනයේ දැනුම පුළුල් කිරීම මගින් සෞන්දර්ය අධ්‍යාපනය, සංස්කෘතිය සහ විනෝදාත්මක ක්‍රියා ක්ෂේත්‍රයන්හි වැඩිදියුණුව සඳහා කැප වීම.

**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**
**ශ්‍රී ලංකාව**

## උපකුලපතිතුමාගේ පණිවිඩය



සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 5 වැනි උපකුලපතිවරයා වශයෙන් 2020 ඔක්තෝබර් මස 13 වන දින රාජකාරි කටයුතු අරඹන ලද මාගේ ඉලක්කය වන්නේ නවීන ඉගෙනුම් හා ඉගැන්වීම් පරිසරය නිර්මාණය කිරීම තුළින් විශ්වවිද්‍යාලයේ කළමනාකාරීත්වය ජාත්‍යන්තර තලය දක්වා වැඩිදියුණු කර යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා නායකත්වය සැපයීමයි.

ගෝලීය වශයෙන් බලපෑම් ඇතිකළ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සීමාකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවුව ද මාගේ දැක්මට අනුව 2021 වර්ෂයේ දී ඉලක්ක සපුරාගැනීමට මම කඩිනම් ක්‍රියාමාර්ග අනුගමනය කළෙමි.

2021 වර්ෂයේ අත්කරගන්නා ලද සුවිශේෂී ජයග්‍රහණ

- පැරණි මාදිලියේ ආපන ශාලාව වෙනුවට නවීන පහසුකම් සහ උසස් තත්ත්වයේ භෝජනාගාර සේවයක් සහිත අවන්හලක් ස්ථාපනය කර ශිෂ්‍යයින් ගේ සහ කාර්ය මණ්ඩලයේ සුභසාධන පහසුකම් වැඩිදියුණු කිරීම.
- ගෝලීය වසංගතය හමුවේ වුවද ශිෂ්‍යයින්ගේ දේශන මාර්ගගත ක්‍රමවේය ඔස්සේ අඛණ්ඩව ඉටුකිරීමට කටයුතු කිරීම.
- 2021 වර්ෂය වන විට අධ්‍යයන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලයේ බඳවාගැනීම් බොහෝ දුරට අවසන් කිරීම.
- විශ්වවිද්‍යාලය විසින් විභාග අංශයට සීමා පනවමින් විභාග කටයුතු ප්‍රතිසංවිධානය කරන ලදී.
- කොවිඩ් 19 වසංගත කාලපරිච්ඡේදය තුළ මාර්ගගත ටෙලි සම්මන්ත්‍රණ මෘදුකාංගය හා ඉගෙනුම් කළමනාකරණ ක්‍රමවේදය භාවිතා කර 2018/2019 අධ්‍යයන වර්ෂය සහ 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා සාර්ථක ලෙස දේශන පවත්වමින් අධ්‍යයන කාර්යමණ්ඩලයේ සියලුම නිලධාරීන් සහ පීය තුනෙහි ම සියලුම විද්‍යාර්ථීන් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමට කටයුතු කිරීම.
- නවීන තාක්ෂණය භාවිතා කර ඉගැන්වීම් සිදු කරන ආකාරය සහ මාර්ගගත ඉගැන්වීම් ක්‍රමය ඵලදායී ලෙස භාවිතා කරන ආකාරය පිළිබඳව අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා වැඩමුළු ගණනාවක් විශ්වවිද්‍යාලය විසින් පැවැත්වීම.
- විශ්වවිද්‍යාලයේ සිසුන් ලියාපදිංචිකිරීම, ඇතුළත්කිරීම්, ගෙවීම් කටයුතු, සතොයක්ෂණය, ශිෂ්‍ය කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, මූල්‍ය, සාමාන්‍ය පරිපාලනය සහ පූර්ව පරීක්ෂණ කටයුතු සහ පශ්චාත් පරීක්ෂණ කටයුතු ඇතුළත් ක්‍රියාවලිය සාර්ථක මෙන් ම කාර්යක්ෂම ලෙස ඉටුකරගැනීමට හැකිවන පරිදි සමස්ත විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය සඳහා විද්‍යුත් කළමනාකරණ පද්ධතියක් (E Management system) ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාලය විසින් පියවර ගැනීම.
- විශ්වවිද්‍යාල හා පාසැල් සිසුන් අතර සෞන්දර්ය කලා ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීමේ අරමුණින් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල රූපවාහිනිය නමින් රූපවාහිනී නාලිකාවක් ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. මෙම කාර්යයෙහි අතිරේක අරමුණ වන්නේ විනෝදාස්වාදය ඉලක්ක කරමින් මහජනතාවගේ උසස් සෞන්දර්යාත්මක රසය ප්‍රවර්ධනය කිරීමයි. සිසුන්ට තමන්ට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රයේ වෘත්තීය දක්ෂතාවය ලබාගැනීම සඳහා මෙම පුහුණු ඒකකය ස්ථාපනය කිරීම.
- සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාලය තුළ සෞන්දර්ය කලා විශ්විද්‍යාල මුද්‍රණාලය නමින් ප්‍රකාශන ඒකකයක් ස්ථාපනය කිරීම.

- සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිලි ඉදිකිරීමෙහි ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මි.) | 2021 වර්ෂය අවසානයේදී වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| සංගීත පීඨය සහ පොදු පහසුකම් සඳහා ගොඩනැගිලි සංකීර්ණය | 775 | 143.97 | ඉදිකිරීම් කාර්යය සැලකිය යුතු ආකාරයෙන් නිම කර ඇති අතර 99% ක ප්‍රගතියක් අත් කරගෙන තිබේ. |
| දෘශ්‍ය කලා පීඨය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 492 | 51.03 | ඉදිකිරීම් කාර්යය සැලකිය යුතු ආකාරයෙන් නිම කර ඇති අතර 99% ක ප්‍රගතියක් අත් කරගෙන තිබේ. |

## විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධක ඒකකයේ කාර්යයන් University Business Linkage (UBL) Cell

- Accelerating Higher Education Expansion and Development (AHEAD) Evaluation ව්‍යාපෘතියේ ඇගයීම් සමාලෝචනය 2021 වර්ෂයේ පෙබරවාරි මස පැවැත්වුණු අතර සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ව්‍යාපාරික සම්බන්ධක ඒකකයට 04 වන අදියර (අවසන් අදියර) සඳහා ගමන් කිරීමට මණ්ඩලයේ ඉහළ නිර්දේශය ලද අතර අවශ්‍ය ක්‍රියාකාරකම් ඉටුකිරීම සඳහා රුපියල් මිලියන 13 ක මුදලක් ලබා දෙන ලදී.

➢ **අත්සන් කරන ලද නව අවබෝධතා ගිවිසුම් සහ නිර්මාණාත්මක සහයෝගීතා ගිවිසුම්**

| | සක්‍රිය අවබෝධතා ගිවිසුම් පිළිබඳ විස්තර | අත්සන් කරන ලද දිනය | අත්සන් කරන ල අනෙක් පාර්ශවය |
|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, MBSL රක්ෂණ සමාගම සහ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම | 2021-01-13 | ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය සහ MBSL රක්ෂණ සමාගම |
| 02 | ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සහ තාක්ෂණ සහ නවෝත්පාදන සහායක මධ්‍යස්ථානය අර අවබෝධතා ගිවිසුම (පාලක සභාවේ අනුමැතිය ලබාගන්නා ලදී). | 2021-03-17 | ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය |

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (ආචාර්ය) රෝහණ පී. මහලියනආරච්චි**
උප කුලපති
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

# පටුන


01. ආයතනික සැලැස්ම සහ විශ්වවිද්‍යාලයේ සංක්ෂිප්ත ඓතිහාසික තොරතුරු 01

01.01 ආයතනික සැලැස්ම 01

01.02 විශ්වවිද්‍යාලයේ සංක්ෂිප්ත ඓතිහාසික තොරතුරු 02

02. විශ්වවිද්‍යාලයීය පාලක සභාව 03

03. විශ්වවිද්‍යාලයීය සනාතන සභාව 04

04. සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර 04

04.01. 2021 වර්ෂයේ සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර 04-05

04.02. සම්පත් සහ සිසුන් පිළිබඳ සංසන්දනාත්මක විස්තර 2020/2021 06

04.03. සිසුන් පිළිබඳ විස්තර - ප්‍රථම උපාධිය 2021 06 - 07

04.04. 2020 සහ 2021 වර්ෂවල ප්‍රථම උපාධිය පිළිබඳ සංසන්දනාත්මක විස්තර 07

05. පශ්චාද් උපාධි පාඨමාලා 08

06. බාහිර උපාධි පාඨමාලා 08

07. ශිෂ්‍යාධාර සහ ශිෂ්‍ය පිරිවැය පිළිබඳ විස්තර 08

07.01. මහපොළ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර පිළිබඳ විස්තර (2021) 08

07.02. ශිෂ්‍ය පිරිවැය (2021) 09

08. නේවාසිකාගාර පහසුකම් බෙදී ඇති ආකාරය (2021) 09

09. කාර්යමණ්ඩල තොරතුරු 09

09.01. අධ්‍යයන/ අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය 09-10

09.02. පරිපාලන සහ මූල්‍ය නිලධාරීන් 10

09.03 අනධ්‍යයන කාර්ය මණ්ඩලය 11

09.04. පර්යේෂණ දීමනා ගෙවීම් පිළිබඳ විස්තර 11

09.05. අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය සේවයෙහි අනුයුක්ත කර ඇති ආකාරය 12

09.06. පරිපාලන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සේවයෙහි අනුයුක්ත කර ඇති ආකාරය 13

09.07. කාර්යමණ්ඩලයේ සමස්ථ වෙනස් වීම් 14

10. කාර්යමණ්ඩල සංවර්ධනය 15

10.01. කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ හා වැඩමුළු 15

10.01.01. අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 15

10.01.02. අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා 16

10.02 විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩල සාමාජිකයින් සහභාගී වූ සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් 16


10.03 විශ්වවිද්‍යාලයේ පුස්තකාල කාර්යමණ්ඩලය සහභාගී වූ සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් 17

| | | |
|---|---|---|
| 11. | යටිතල පහසුකම් පිළිබඳ විස්තර | 17 |
| 12. | පුස්තකාල ග්‍රන්ථ එකතුව පිළිබඳ සංසන්දනාත්මක විස්තර 2020/2021 | 17 |
| 13. | ක්‍රමෝපායික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම | 17 |
| | 13.01. ක්‍රමෝපායික සැලැස්ම | 17 |
| | 13.02. ක්‍රියාකාරී සැලැස්ම | 18 |
| 14. | වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයෙහි කටයුතු | 18 |
| 15. | තොරතුරු තාක්‍ෂණ මධ්‍යස්ථානය | 18 |
| 16. | සී. ද එස්. කුලතිලක සංරක්ෂණ සහ පර්යේෂණ ඒකකයේ කටයුතු | 19 |
| 17. | තත්ත්ව ආරක්‍ෂණ මධ්‍යස්ථානය | 19-20 |
| 18. | ශාරීරික අධ්‍යාපන ඒකකයේ කටයුතු | 20 |
| 19. | තොරතුරු ඒකකය | 21 |
| 20. | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය | 21 |
| 21. | විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය (University Business Linkage Cell) | 22-24 |
| 22. | ජාත්‍යන්තර සබඳතා මධ්‍යස්ථානය | 24-25 |
| 23. | පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම - 2021 | 25-28 |
| 24. | විගණන කමිටු වාර්තාව - 2021 | 29 |
| 25. | තිරසර සංවර්ධනය මත පදනම් කරගත් අනාගත අපේක්ෂා පිළිබඳ වාර්තාව | 30 |
| 26. | 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති | 31-54 |
| 27. | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව | 55-60 |
| 28. | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව- පිළිතුරු | 61-63 |

# 01.සංවිධාන සැලැස්ම සහ විශ්වවිද්‍යාලයේ සංක්ෂිප්ත ඓතිහාසික තොරතුරු

## 01.01 සංවිධාන සැලැස්ම

Organizational Structure – University of the Visual and Performing Arts




LIST OF ACRONYMS

CODL - Center for Open and Distance Learning
SDC - Staff Development Center
CGU - Carrier Guidance Unit
CQA - Center for Quality Assurance
Phy. Ed. - Physical Education
ITC - Information Technology Center
IU - Information Unit
AVU - Audio Visual Unit
CIR - Center for International Relations

## 01.02 විශ්වවිද්‍යාලයේ සංක්ෂිප්ත ඓතිහාසික තොරතුරු

1983 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද මරදාන කාර්මික විද්‍යාලයේ හි පැවති විෂයන් අතර චිත්‍ර හා පින්තාරු කලාව සඳහා ද අධ්‍යයන අංශයක් වෙන්ව පැවතිණි. සිසුන් 48 දෙනෙකුගෙන් ආරම්භ වූ මෙම ආයතනයේ ශිෂ්‍ය සංඛ්‍යාව 1902 වර්ෂය වන විට 200 පමණ දක්වා වර්ධනය වූ බව සටහන් මඟින් පෙන්නුම් කෙරේ. 1933 වර්ෂය වන විට චිත්‍රකර්මය, පින්තාරු කලාව, මූර්ති කලාව යන ශිල්ප ආවරණය කරමින් කලා විෂය ධාරාව විකාශනය වූ අතර හස්ත කර්මාන්තය සහ ඡායාරූප ශිල්පය යන විෂයන් ඇතුළත්ව 1942 වර්ෂය වන විට කලා හා කලා ශිල්ප නමින් වෙනම අධ්‍යයනාංශයක් බවට පරිවර්තනය විය.

1949 ඔක්තෝබර් මස 01 වන දින සිට කාර්මික විද්‍යාලය වෙනම දෙපාර්තමේන්තුවක් බවට පත් වීමෙන් පසු කලා හා කලා ශිල්ප අංශය හෝර්ටන් පෙදෙසේ හේවුඩ් මන්දිරය වෙත ගෙන යන ලද අතර එහි ප්‍රධානාචාර්ය ධූරයට පත්වූයේ කලාගුරු ජේ.ඩී.ඒ. පෙරේරා මහතා ය. 1952 ජූලි මස 01 වන දින මෙම ආයතනයට සංගීත සහ නර්තන අංශ එකතු වීමෙන් පසු එය රජයේ ලලිත කලා ආයතනය බවට පත් කරන ලදී. පසුව 1953 ඔක්තෝබර් මස 01 වන දින සංගීත හා නර්තන අංශ ඇල්බට් චන්ද්‍රවංකය වෙත රැගෙන යන ලදී. 1956 වර්ෂයේ දී මෙම ආයතනය ශ්‍රී ලංකා ජාතික කලායතනය වශයෙන් නම් කරන ලද අතර පළාත් පාලන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතට ගන්නා ලදී.

1965 වර්ෂයේදී මෙම ආයතනය නැවත අධ්‍යාපන අමාත්‍යාංශය යටතට ගන්නා ලද අතර රජයේ චිත්‍ර විද්‍යාලය, රජයේ සංගීත විද්‍යාලය හා රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලය වශයෙන් විද්‍යාල තුනක් බවට පත් කර ඒවා විදුහල්පතිවරුන්ගේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක කරන ලදී. ප්‍රවීන චිත්‍ර ශිල්පී ස්ටැන්ලි අබේසිංහ මහතා රජයේ චිත්‍ර හා මූර්ති විද්‍යාලයේ ද, ප්‍රවීන සංගීතඥ ලයනල් එදිරිසිංහ මහතා රජයේ සංගීත විද්‍යාලයේද, ප්‍රවීන නර්තන ශිල්පී එස්. පණිභාරත මහතා රජයේ මුද්‍රා හා නැටුම් විද්‍යාලයේ ද විදුහල්පතිවරුන් වශයෙන් පත් කරන ලදී.

දශක අටකට අධික කාලයක් ජාතික සංස්කෘතිය සහ කලාවන් පිළිබඳ අවධීන් රැසක් පසුකරමින් මෙම ආයතනය 1972 අංක 01 දරන විශ්වවිද්‍යාල පනතේ 85(4) ඡේදය යටතේ 1974 මැයි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය බවට පත් කරන ලදී.

1978 වර්ෂයේ දී මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රථම ලලිත කලාවේදී උපාධිධාරී කණ්ඩායම බිහි වූ අතර එය උපාධිධාරීන් 63 දෙනෙකුගෙන් සමන්විත විය.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සම්මතවීමත් සමඟ එවකට පැවති විශ්වවිද්‍යාල මණ්ඩප වෙනම විශ්වවිද්‍යාල බවට පරිවර්තනය වූ අතර 1979 අංක 10 දරන ආඥාපනත මඟින් සෞන්දර්ය අධ්‍යයන ආයතනය 1980 වර්ෂයේ සිට කැලණිය විශ්වවිද්‍යාලයේ අනුබද්ධ ආයතනයක් බවට පත්විය.

### විශ්වවිද්‍යාලය පිහිටුවීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාවේ (2) වන ඡේදය සමඟ කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව අංක 1400/24 දරන රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් කැලණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය 2005 ජූලි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය වශයෙන් ස්ථාපනය කරන ලදී.

### මේ දක්වා පත්ව ඇති කුලපතිවරුන්

| | |
|---|---|
| ප්‍රථම කුලපති | ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් |
| දෙවන කුලපති | ආචාර්ය ඩබ්ලිව්.ඩී. අමරදේව |
| තෙවන කුලපති | මහාචාර්ය සංගීත් නිපුන් සනත් නන්දසිරි |

## 02 විශ්වවිද්‍යාලයීය පාලක සභාව

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 44 වන වගන්තිය ප්‍රකාරව සහ 1985 අංක 07 දරන (සංශෝධිත) විශ්වවිද්‍යාල පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව පත් කරන ලද විශ්වවිද්‍යාලයේ විධායක මණ්ඩලය මෙන් ම පාලන අධිකාරිය වන විශ්වවිද්‍යාලයීය පාලක සභාව 2021 වර්ෂයේ දී පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත විය.

| | |
|---|---|
| උපකුලපති (සභාපති) | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (ආචාර්ය) රෝහණ පී මහලියනආරච්චි |
| පීඨාධිපතිවරු | |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | මහාචාර්ය කෝලිත භානු දිසානායක |
| දෘශ්‍ය කලා පීඨය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජගත් රවීන්ද්‍ර මහතා |
| සංගීත පීඨය | ආචාර්ය පී.කේ.එස්.පී. රත්නකුමාර |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | ආචාර්ය ඉන්දික ෆර්ඩිනැන්ඩු මහතා |
| වෙනත් | |
| සනාතන සභාවේ නියෝජිත | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජේ.ඒ.එස්.පී. අරවින්දන මහතා (2021.02.25 දින සිට) |
| | ආචාර්ය වජිර නලින්ද ජයතිලක (2021.07.17 දින සිට) |
| | ආචාර්ය තරංග දංදෙණිය (2021.04.07 දින සිට) |
| විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද | මහාචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස |
| | මහාචාර්ය කුසුමා කරුණාරත්න (මිය ) |
| | මහාචාර්ය නිමල් කීර්ති දංගල්ල |
| | ගුණසේන තේනබඳු මහතා |
| | ලක්ෂ්මන් අබේසේකර මහතා |
| | රංජිත් ලියනගේ මහතා |
| | වී.ධර්මරාජා මහතා |
| | සී.මාලියද්ද මහතා |
| නිල බලයෙන් පාලක සභාවේ ලේකම් | බී.එම්.දයාවංශ මහතා , ලේඛකාධිකාරී |
| වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව 10 කි. | |

## 03 විශ්වවිද්‍යාලයීය සනාතන සභාව

| | |
|---|---|
| උපකුලපති (සභාපති) | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (ආචාර්ය) රෝහණ පී මහලියනආරච්චි |
| පීඨාධිපතිවරු | |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | මහාචාර්ය කෝලිත භානු දිසානායක |
| දෘශ්‍ය කලා පීඨය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ජගත් රවීන්ද්‍ර මහතා |
| සංගීත පීඨය | ආචාර්ය පී.කේ.එස්.පී.රත්නකුමාර |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | ආචාර්ය ඉන්දික ෆර්ඩිනැන්ඩු |
| සියලුම මහාචාර්යවරු | |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | මහාචාර්ය කරුණාරත්න බණ්ඩාර |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | මහාචාර්ය එස්.පී.ඩී. ලියනගේ |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | මහාචාර්ය මංගල සේනානායක |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | මහාචාර්ය කේ.ඩී.එස්. රාජපක්ෂ (මිය) |
| දෘශ්‍ය කලා පීඨය | මහාචාර්ය චන්ද්‍රගුප්ත තේනුවර |
| නිල බලයෙන් සනාතන සභාවේ ලේකම් | බී.එම්.දයාවංශ මහතා, ලේඛකාධිකාරී |
| සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් 07 ක් පවත්වන ලදී. | |

ඉහත සඳහන් නිලධාරීන්ට අමතරව 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල පනතේ 26(2) (i) වගන්තිය යටතේ තෝරා ගන්නා ලද සියලුම අධ්‍යයනාංශ ප්‍රධානීන් සහ සාමාජිකයන් ද සනාතන සභාව නියෝජනය කරනු ලැබේ.

## 04 සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

### 04.01 2021 වර්ෂයේ සම්පත් සහ සිසුන් පිළිබඳ විස්තර

| පීඨය | අධ්‍යයනාංශය | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | | | මුළු අධ්‍යයන කාර්යමණ්ඩලය | මුළු අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය | මුළු තාවකාලික කථිකාචාර්යවරුන් | මුළු බාහිර කථිකාචාර්යවරුන් සංඛ්‍යාව | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පළමු වන වසර | දෙවන වසර | තෙවන වසර | සිව්වන වසර | | | | | |
| දෘශ්‍ය කලා පීඨය | චිත්‍ර කලා | 97* (2018/2019) 111 * (2019/2020) | 19 | 17 | 24 | 06 | - | 01 | 14 | 31 |
| | මූර්ති කලා | | 08 | 11 | 07 | 05 | - | - | 07 | |
| | දෘශ්‍ය සන්නිවේදන සැලසුම් | | 11 | 10 | 11 | 05 | - | 01 | 23 | |
| | සෙරමික් කලා | | 09 | 07 | 05 | 01 | 01 | 02 | 13 | |
| | බහු ශික්ෂණාත්මක නිර්මාණ සැලසුම් | | 10 | 11 | 09 | 04 | - | 03 | 09 | |
| | රෙදිපිළි හා ඇඟලුම් කලා | | 12 | 11 | 09 | 03 | - | 01 | 21 | |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ඉතිහාසය සහ කලා සිද්ධාන්ත | | 05 | 11 | 09 | 04 | - | 02 | 13 | |
| | බහු මාධ්‍ය කලා | | 13 | 10 | 11 | 02 | - | 02 | 15 | |
| | මුද්‍රණ කලා | | 08 | 08 | 08 | 04 | - | 01 | 11 | |
| **මුළු සංඛ්‍යාව** | | **208** | **95** | **96** | **93** | **34** | **01** | **13** | **126** | **31** |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | **අධ්‍යයනාංශය** | 1 වන වසර | 2 වන වසර | 3 වන වසර | 4 වන වසර | | | | | 23 |
| | උඩරට නර්තන | 242* 2018/2019 | 89 | 89 | 87 | 15 | 03 | - | - | |
| | පහතරට නර්තන | | 33 | 43 | 35 | 08 | 02 | - | - | |
| | සබරගමු නර්තන | | 15 | 23 | 18 | 06 | 01 | - | - | |
| | තාල වාද්‍ය සංගීත | 289* 2019/2020 | 05 | 04 | 06 | 04 | - | - | - | |
| | ඉන්දියානු හා ආසියානු නර්තන | | 33 | 14 | 14 | 09 | 03 | - | 02 | |
| | නර්තන හා රංග කලා ඉතිහාසය සහ සිද්ධාන්ත | | 64 | 45 | 43 | 06 | - | - | 15 | |
| | නාට්‍ය, මුද්‍රා නාට්‍ය හා නූතන නර්තන | 49* (2018/2019) 71* (2019/2020 | 49 | 33 | 33 | 12 | 02 | - | 04 | |
| | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම් | - | - | - | - | 02 | - | 05 | 09 | |
| **මුළු සංඛ්‍යාව** | | **651** | **288** | **251** | **236** | **62** | **11** | **05** | **30** | **23** |
| සංගීත පීඨය | **අධ්‍යයනාංශය** | 1 වන වසර | 2 වන වසර | 3 වන වසර | 4 වන වසර | | | | | 21 |
| | උත්තර භාරතීය සම්භාව්‍ය සංගීතය | 295* 2018/2019 | 81 | 92 | 114 | 22 | 08 | - | 09 | |
| | දක්ෂිණ භාරතීය සංගීත | | 02 | 03 | 06 | 01 | 02 | - | 02 | |
| | බටහිර සංගීත | | 34 | 41 | 34 | 06 | - | - | 38 | |
| | මානවවංශ සංගීත විද්‍යා | 241* 2019/2020 | 36 | 42 | 29 | 07 | 03 | - | 03 | |
| | ව්‍යවහාරික සංගීතය සහ ජනසන්නිවේදන | | 47 | 14 | 11 | 04 | 01 | - | 24 | |
| | සංගීත විද්‍යා | | 40 | 19 | 27 | 04 | - | - | 08 | |
| | සංරක්ෂණ සහ පර්යේෂණ ඒකකය | - | - | - | - | - | 01 | - | - | |
| **මුළු සංඛ්‍යාව** | | **536** | **240** | **211** | **221** | **44** | **15** | **-** | **84** | **21** |

* මේ වන විට 2018/2019 අධ්‍යයන වර්ෂයේ සහ 2019/2020 අධ්‍යයන වර්ෂයේ පළමු වසර ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් අධ්‍යයන කටයුතු වල නිරත වෙමින් පවතියි.

## 04.02 සම්පත් සහ සිසුන් පිළිබඳ සංසන්දනාත්මක විස්තර - 2020/2021

| පීඨය | | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | | මුළු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | | මුළු තාවකාලික කථිකාචාර්ය මණ්ඩලය | | මුළු බාහිර කථිකාචාර්ය මණ්ඩලය | | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2020 | 2021 | 2020 | 2021 | 2020 | 2021 | 2020 | 2021 | 2020 | 2021 | 2020 | 2021 |
| දෘශ්‍ය කලා | | 379 | 492 | 35 | 38 | 01 | 01 | 20 | 09 | 126 | 127 | 32 | 31 |
| නර්තන සහ නාට්‍ය කලා | නර්තන | 898 | 1190 | 58 | 64 | 15 | 11 | 04 | - | 71 | 20 | 23 | 23 |
| | නාට්‍ය කලා | 164 | 234 | | | | | | | | | | |
| සංගීතය | | 906 | 1208 | 38 | 44 | 17 | 15 | 02 | - | 46 | 56 | 18 | 21 |
| මුළු සංඛ්‍යාව | | **2183** | **3124** | **131** | **146** | **33** | **27** | **26** | **09** | **243** | **203** | **73** | **75** |

## 04.03 සිසුන් පිළිබඳ විස්තර

### ප්‍රථම උපාධිය 2021

| පීඨය | උපාධි පාඨමාලාව | | ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|
| | | | පළමු වසර | දෙවන වසර | තෙවන වසර | සිව්වන වසර |
| දෘශ්‍ය කලා පීඨය | චිත්‍ර කලා | | 97 | 19 | 17 | 24 |
| | මූර්ති කලා | | 2018/2019 | 08 | 11 | 07 |
| | දෘශ්‍ය සන්නිවේදන කලා | | 111 | 11 | 10 | 11 |
| | සෙරමික් කලා | | 2019/2020 | 09 | 07 | 05 |
| | බහු ශික්ෂණාත්මක නිර්මාණ කලා | | | 10 | 11 | 09 |
| | රෙදිපිළි හා ඇඟළුම් කලා | | | 12 | 11 | 09 |
| | ඉතිහාසය හා කලා සිද්ධාන්ත | | | 05 | 11 | 09 |
| | බහු මාධ්‍ය කලා | | | 13 | 10 | 11 |
| | මුද්‍රණ කලා | | | 08 | 08 | 08 |
| **එකතුව** | | | **208** | **95** | **96** | **93** |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | උඩරට නර්තන | | | 89 | 89 | 87 |
| | පහතරට නර්තන | | | 33 | 43 | 35 |
| | සබරගමු නර්තන | | | 15 | 23 | 18 |
| | වාද්‍ය සංගීත | | | 05 | 04 | 06 |
| | ඉන්දියානු සහ ආසියානු නර්තන | | | | | |
| | | කථක් නර්තනය | | 22 | 09 | 09 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | භරත නාට්‍යම් නර්තනය | 242 2018/2019 | 11 | 05 | 05 |
| | නර්තන හා රංග කලා ඉතිහාසය සහ සිද්ධාන්ත | | | | | |
| | | වීඩියෝ නර්තන රචනය | 289 2019/2020 | 27 | 12 | 17 |
| | | සන්නිවේදනය සහ ජනශ්‍රැති අධ්‍යයනය | | 25 | 25 | 18 |
| | | ඩිජිටල් සිනමාව | | 12 | 08 | 08 |
| | නාට්‍ය කලා, මුද්‍රා කලා හා නූතන නැටුම් | | | | | |
| | | රංගනය හා රඟදැක්වීම පුහුණුවීම | 49 2018/2019 | 33 | 26 | 23 |
| | | තිර රචනය සහ අධ්‍යක්ෂණය | 71 2019/2020 | 11 | 04 | 04 |
| | | මුද්‍රා නාට්‍ය සහ නව නර්තනය | | 05 | 09 | 05 |
| එකතුව | | | **651** | **288** | **251** | **236** |
| සංගීත පීඨය | උත්තර භාරතීය සංගීත | | 295 2018/2019 | 81 | 92 | 114 |
| | දක්ෂිණ භාරතීය සංගීත | | | 02 | 03 | 06 |
| | බටහිර සංගීත | | | 34 | 41 | 34 |
| | මානව වංශ සංගීත | | 241 2019/2020 | 36 | 42 | 29 |
| | ව්‍යවහාරික සංගීත සහ ජන සන්නිවේදන | | | 47 | 14 | 11 |
| | සංගීත විද්‍යාව | | | 40 | 19 | 27 |
| **මුළු සංඛ්‍යාව** | | | **536** | **240** | **211** | **221** |

## 04.04 2020 සහ 2021 වර්ෂවල ප්‍රථම උපාධිය පිළිබඳ සංසන්දනාත්මක විස්තර

| පීඨය | | ඇතුළත් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව | | උපාධිය ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව | | උපාධිය සම්පූර්ණ නොකළ ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | 2020 | 2021 | 2020 | 2021 | 2020 | 2021 |
| දෘශ්‍ය කලා පීඨය | | 96 | 111 | 95 | * | 03 | * |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | නර්තනය | 240 | 289 | 244 | * | 03 | * |
| | නාට්‍ය කලා | 49 | 70 | | | | |
| සංගීත පීඨය | | 234 | 295 | 202 | * | 25 | * |
| **එකතුව** | | **619** | **765** | **541** | * | **31** | * |

- කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අදාළ වර්ෂය තුළ සිසුන් උපාධි නොලබන ලදී.

## 05 පශ්චාත් උපාධි පාඨමාලා

| පාඨමාලාවේ නම | 2021 වර්ෂයේ ඇතුළත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 2021 වර්ෂයේ උපාධි අවසන් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව | පශ්චාත් උපාධි නිබන්ධන ඇගයීම සඳහා ඉදිරිපත් කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| දර්ශනපති උපාධිය (M.Phil.) | 04 | 03 | 03 |
| දර්ශනශූරී උපාධිය (Ph.D.) | 01 | 03 | 04 |
| ශාස්ත්‍රපති උපාධිය (MA) | - | 03 | - |
| ප්‍රාසාංගික කලාපති උපාධිය (MPA) | - | 03 | - |

## 06 බාහිර උපාධි පාඨමාලා

විවෘත සහ දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් මේ වන විට පවත්වාගෙන යනු ලබන පාඨමාලා පිළිබඳ විස්තර

| පාඨමාලාවේ නම | අධ්‍යයන වර්ෂය | ඇතුළත් කරගැනීම | පාඨමාලාවේ කාලසීමාව | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| නර්තනය පිළිබඳ ඩිප්ලෝමාව | 2019/2020 | (1 වන ඇතුළත් කරගැනීම) | අවුරුදු 01 | 64 |
| නර්තනය පිළිබඳ ඩිප්ලෝමාව | 2019/2020 | (2 වන ඇතුළත් කරගැනීම) | අවුරුදු 01 | 46 |
| නර්තනය පිළිබඳ ඩිප්ලෝමාව | 2020/2021 | | අවුරුදු 01 | 35 |
| චිත්‍ර කලාව හා පින්තාරු පාඨමාලාව | 2019/2020 | (1 වන ඇතුළත් කරගැනීම) | අවුරුදු 01 | 40 |
| චිත්‍ර කලාව හා පින්තාරු පාඨමාලාව | 2019/2020 | (2 වන ඇතුළත් කරගැනීම) | අවුරුදු 01 | 40 |
| පෙරදිග සංගීතය පිළිබඳ ඩිප්ලෝමාව (ගායන) | 2020/2021 | | අවුරුදු 01 | 22 |

## 07 ශිෂ්‍යාධාර සහ ශිෂ්‍ය පිරිවැය පිළිබඳ විස්තර

### 07.01 මහපොළ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර පිළිබඳ විස්තර (2021)

| පීඨය | | මහපොළ ශිෂ්‍යත්වලාභීන් | | ශිෂ්‍යාධාරලාභීන් | |
|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | ගෙවා ඇති මුදල | සංඛ්‍යාව | ගෙවා ඇති මුදල (රු.) |
| දෘශ්‍ය කලා | | 222 | 10,017,700.00 | 151 | 3,880,000.00 |
| නර්තන හා නාට්‍ය කලා | නර්තන | 455 | 22,747,000.00 | 421 | 11,471,000.00 |
| | නාට්‍ය කලා | 63 | 3,150,000.00 | 97 | 1,888,000.00 |
| සංගීත | | 279 | 13,990,500.00 | 299 | 8,240,000.00 |
| **එකතුව** | | **956** | **46,755,200.00** | **968** | **25,479,000.00** |

## 07.02 ශිෂ්‍ය පිරිවැය (2021)

| | |
|---|---|
| සම්පූර්ණ පුනරාවර්තන වියදම | 1,110,985,082.00 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 3124 |
| වාර්ෂික ඒක ශිෂ්‍ය පිරිවැය | 355,629.02 |

## 08 නේවාසිකාගාර පහසුකම් බෙදී ඇති ආකාරය (2021)

| නේවාසිකාගාරයේ නම | නේවාසික පහසුකම් ලබා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| දෙහිවල පිරිමි නේවාසිකාගාරය | 76 | 382 |
| දෙහිවල කාන්තා නේවාසිකාගාරය | - | |
| රාජගිරිය කාන්තා නේවාසිකාගාරය | 306 | |

| | | |
|---|---|---|
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 1524 | |
| නේවාසිකාගාර පහසුකම් ලද ශිෂ්‍ය සංඛ්‍යාව | 382 | (එක් මසක් සඳහා) |
| පෞද්ගලික නවාතැන් භාවිතා කරන ලද බවට අනුමාන කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව | – | * |
| දුම්රිය වාර ප්‍රවේශපත්‍ර ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | – | * |
| ලංගම වාර ප්‍රවේශපත්‍ර ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | – | * |

- කොවිඩ් 19 සීමාවන් හේතුවෙන් මාර්ගගත ටෙලි සම්මන්ත්‍රණ මෘදුකාංගය භාවිතා කර අධ්‍යයන කටයුතු සිදු කරන ලදී.

| | |
|---|---|
| නේවාසික පහසුකම් සැපයිය හැකි සංඛ්‍යාව | 1524 |
| පිරිමි | 400 |
| කාන්තා | 1124 |

## 09 කාර්යමණ්ඩල තොරතුරු

### 09.01 අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය

| | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | මේ වන විට සේවයේ නිරත සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| කථිකාචාර්ය | U - AC 3 (I) -(IV) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 178 | 144 | 23 |
| සහාය මහාචාර්ය | U - AC 4 | ජ්‍යෙෂ්ඨ මට්ටම | | 03 | |
| මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | U - AC 5 | ජ්‍යෙෂ්ඨ මට්ටම | | 08 | |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය 1 ඛණ්ඩය | U- AS 1** | තෘතීය මට්ටම | 76 | 27 | 27 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය 2 ඛණ්ඩය | U- AS 2 | තෘතීය මට්ටම | 15 | 10 | 05 |

** විශ්වවිද්‍යාලය සඳහා අනුමත කරන ලද කාර්ය මණ්ඩලය අනුව තනතුරු 38 ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන්ට පෞද්ගලික වන සේ තනතුරු අනුමත කිරීමේ පදනම මත අනුමත කර තිබේ. එම තනතුරුවලට උපදේශකවරු සහ ප්‍රදර්ශකවරු ඇතුළත් වේ. අනුමත තනතුරු 38 න් (නිලධාරීන්ට පෞද්ගලික වන සේ තනතුරු අනුමත කිරීමේ පදනම මත අනුමත කරන ලද) නිලධාරීන් පත්ව සිටින්නේ 16 දෙනෙකු පමණි. 27 ක් වන තථ්‍ය සේවක සංඛ්‍යාවට ඉහත සඳහන් පරිදි උපදේශකවරුන් සහ ප්‍රදර්ශකවරුන් 16 දෙනෙකු ද සහාය වාදකයන් 10 දෙනෙකු ද විද්‍යාත්මක සහකාරවරයකු ද ඇතුළත් වේ. මීට අමතරව සහාය වාදක තනතුරු 27 ක් සඳහා පුරප්පාඩු පවතියි.

## 09.02 පරිපාලන සහ මූල්‍ය නිලධාරීන්

| තනතුර | වැටුප් කේතය | සේවා මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ලේඛකාධිකාරී | U-EX3(I) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| මූල්‍යාධිකාරී | U-EX3 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| වැඩ ඉංජිනේරු | U-EX 1 / U-EX2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ නියෝජ්‍ය ලේඛකාධිකාරී | U-EX 2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 7 | 5 | 2 |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී/ නියෝජ්‍ය මූල්‍යාධිකාරී | U-EX 2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 2 | 5* | 0 |
| ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක/ නියෝජ්‍ය අභ්‍යන්තර විගණක | U-EX 2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | 0 |
| සහකාර ලේඛකාධිකාරී | U-EX1 | තෘතීය මට්ටම | 9 | 8 | 1 |
| සහකාර ලේඛකාධිකාරී - නීති හා ප්‍රලේඛන අංශය | U-EX1 | තෘතීය මට්ටම | 1 | 1 | 0 |
| සහකාර අභ්‍යන්තර විගණක | U-EX1 | තෘතීය මට්ටම | 1 | 1 | 0 |
| සහකාර මූල්‍යාධිකාරී | U-EX1 | තෘතීය මට්ටම | 4 | 1 | 0* |
| ප්‍රධාන විනයාරක්ෂක නිලධාරී | U-EX2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 1 |
| භාරකරු (චිත්‍ර ප්‍රදර්ශන ශාලාව) | U-EX1 | තෘතීය මට්ටම | 1 | 0 | 1 |
| ව්‍යාපෘති කළමනාකරු | U-EX1 U-EX2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 0 | 1 |
| වෛද්‍ය නිලධාරී | U-MO1 | තෘතීය මට්ටම | 1 | 1 | 0 |
| අධ්‍යක්ෂ (ශාරීරික අධ්‍යාපනය) | U-EX2 | තෘතීය මට්ටම | 1 | 0 | 1 |
| **එකතුව** | | | **33** | **26** | **07** |

* APER උසස්වීම්

## 09.03 අනධ්‍යයන කාර්යමණ්ඩලය

| සේවා ඛණ්ඩය | වැටුප් කේතය | තථ්‍ය සේවක සංඛ්‍යාව | අනුමත සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ප්‍රාථමික මට්ටම | | | | |
| ප්‍රාථමික සේවා ඛණ්ඩය – පුහුණු | PL - 1 | 59 | 113 | 28* |
| ප්‍රාථමික සේවා ඛණ්ඩය – අර්ධ පුහුණු | PL - 2 | 06 | | |
| ප්‍රාථමික සේවා ඛණ්ඩය– නුපුහුණු | PL - 3 | 20 | | |
| ද්විතියික මට්ටම | | | | |
| කළමනාකරණ සහකාර | U - MN 1 | 100 | 117 | 07** |
| කාර්යමණ්ඩල සහායක/ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර | U - MN 4 | 10 | | |
| කළමනාකරණ සහකාර – තාක්ෂණික | U - MT 1 | 10 | 17 | 07 |
| කළමනාකාරණ සහකාර – තාක්ෂණික නොවන | U - MT 1 | 03 | 03 | |
| සහය නිලධාරී – 2 වන ඛණ්ඩය | U - MN 2 | 01 | 02 | 01 |
| සහය නිලධාරී – 2 වන ඛණ්ඩය – තාක්ෂණික නොවන | U - MN 3 | 03 | 03 | |
| සහය නිලධාරී 2 වන ඛණ්ඩය – තාක්ෂණික | U - MN 3 | 03 | 03 | |

* තනතුරු 01 ක් තනතුර දරන නිලධාරියාට ම පෞද්ගලික වේ.

** තනතුරු 02 ක් තනතුර දරන නිලධාරින්ට ම පෞද්ගලික වේ.

## 09.04 පර්යේෂණ දීමනා ගෙවීම් පිළිබඳ විස්තර

| පීඨය/ අංශය | පර්යේෂණ දීමනා ලද නිලධාරීන් සංඛ්‍යාව | පර්යේෂණ දීමනා නොලද නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 60 | 02 |
| සංගීත පීඨය | 41 | 01 |
| දෘශ්‍ය කලා පීඨය | 28 | 08 |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 03 | - |
| විධායක කාර්ය මණ්ඩලය | 14 | 01 |
| පුස්තකාලය | 04 | - |
| **මුළු එකතුව** | **150** | **12** |

## 09.05 අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය සේවයෙහි අනුයුක්ත කර ඇති ආකාරය

| | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය / කථිකාචාර්ය (සේවයේ ස්ථිර නොකළ) | කථිකාචාර්ය (පරිවාස) | සහකාර කථිකාචාර්ය (තාවකාලික) | උපදේශක | සහාය වාදක | නිදර්ශක | බාහිර කථිකාචාර්ය | විද්‍යාත්මක සහකාර (II ශ්‍රේණිය) | සහකාර පරිගණක ජාල කළමනාකරු ( II ශ්‍රේණිය) | ශාරීරික අධ්‍යාපන උපදේශක (I ශ්‍රේණිය) / ( III ශ්‍රේණිය) | ක්‍රම සම්පාදක සහ පද්ධති විශ්ලේෂක (I ශ්‍රේණිය) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උපකුලපති | 01 | අදාළ නොවේ | | | | | | | | | | | | | |
| සංගීත පීඨය | - | 01 | 01 | 32 | 04 | 06 | -- | 06 | 08 | -- | 56 | 01 | - | - | - |
| දෘශ්‍ය කලා පීඨය | - | 01 | 02 | 17 | 01 | 17 | 09 | 01 | - | - | 127 | - | - | - | - |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | - | 04 | -- | 30 | 11 | 19 | -- | 07 | 02 | 02 | 20 | - | - | - | - |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | - | - | - | 03 | - | - | - | 05 | - | - | - | - | 02 | - | - |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | අදාළ නොවේ | | | | | | | | | | | | | 02 | - |
| විභාග අංශය | අදාළ නොවේ | | | | | | | | | | | | | | 01 |
| බහු ශික්ෂණාත්මක අධ්‍යයන | - | - | - | 01 | - | - | - | - | - | - | - | - | - | - | - |

| | පුස්තකාලයාධිකාරී | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | සහකාර පුස්තකාලයාධිකාරී |
|---|---|---|---|
| පුස්තකාලය | 01 | 03 | - |

## 09.06 පරිපාලන සහ අනධ්‍යයන කාර්යමණ්ඩලය සේවයෙහි අනුයුක්ත කර ඇති ආකාරය

| පීඨය/ අංශය | පාලන | අනධ්‍යයන | |
|---|---|---|---|
| | | කළමනාකරණ සහ සමාන්තර ශ්‍රේණි | කණිෂ්ඨ ශ්‍රේණි |
| දෘශ්‍ය කලා පීඨය | 02 | 16 | 15 |
| නර්තන හා නාට්‍ය කලා පීඨය | 01 | 16 | 07 |
| සංගීත පීඨය | 01 | 15 | 06 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | 02 | 02 | 01 |
| උපකුලපති කාර්යාලය | 01 | 03 | 02 |
| ලේඛකාධිකාරී කාර්යාලය | 02 | 02 | 01 |
| අධ්‍යයන ආයතන අශය | 01 | 05 | 02 |
| අනධ්‍යයන ආයතන අංශය | 01 | 03 | 01 |
| විභාග අංශය | 01 | 06 | 01 |
| අධ්‍යයන සහ ශිෂ්‍ය කටයුතු අංශය | 01 | 09 | 01 |
| සාමාන්‍ය පාලන අංශය | 01 | 05 | 07 |
| මූල්‍ය අංශය | 05 | 16 | 03 |
| පර්යේෂණ සහ නිර්මාණ කටයුතු සංවර්ධන අංශය | 01 | 02 | 01 |
| අභ්‍යන්තර විගණන අංශය | 02 | 01 | 01 |
| නීති හා ප්‍රලේඛන අංශය | 01 | 01 | 01 |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | 00 | 01 | 01 |
| විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය | 01 | 04 | 01 |
| කොහුවල පරිශ්‍රය (පරිපාලන) | - | 01 | - |
| කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | 00 | - | - |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | 00 | - | - |
| විශ්වවිද්‍යාලයීය වෛද්‍ය මධ්‍යස්ථානය | 01 | 01 | 03 |
| නඩත්තු අංශය | 01 | 03 | 17 |
| සංයුක්ත කළමනාකරණ අංශය | 00 | 01 | - |
| පුස්තකාලය | 00 | 08 | 05 |
| තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 00 | 02 | - |
| ආරක්ෂක අංශය | 00 | 04 | 07 |
| මූලධන කාර්යාලය | 01 | 01 | - |
| විශ්වවිද්‍යාල මුද්‍රණාලය (VAPA) | - | 02 | - |

## 09.07 කාර්යමණ්ඩලයේ සමස්ත වෙනස්වීම්

| | අධ්‍යයන | අධ්‍යයන සහායක | පරිපාලන සහ මූල්‍ය | අනධ්‍යයන |
|---|---|---|---|---|
| නව තනතුරු | 17 | 05 | 00 | 12 |
| සේවයේ ස්ථිර කිරීම | 04 | 00 | 02 | 26 |
| උසස්වීම් | 09 | 01 | 00 | 15 |
| මාරුවීම් (වෙනත් විශ්වවිද්‍යාල වලින්) | 00 | 00 | 00 | 07 |
| විශ්‍රාමයෑම් | 00 | 02 | 01 | 03 |
| ඉල්ලා අස්වීම් | 00 | 00 | 00 | 01 |
| තනතුර අත්හැර යාම් | 00 | 00 | 00 | 01 |
| සේවය අත්හිටුවීම | 00 | 00 | 00 | - |
| සේවය අවසන්කිරීම් | 01 | 00 | 00 | - |
| සේවයෙන් ඉවත්වීම් | 00 | 00 | 00 | - |
| සප්ත වාර්ෂික නිවාඩු | 03 | අදාළ නොවේ | 01 | - |
| අධ්‍යයන නිවාඩු (දේශීය) | 06 | 01 | 00 | - |
| අධ්‍යයන නිවාඩු (විදේශීය) | 03 | 00 | 00 | - |
| අධ්‍යයන නිවාඩු දීර්ඝකිරීම | 02 | 00 | 00 | - |
| සප්ත වාර්ෂික නිවාඩු අවසන් වී රාජකාරියට වාර්තා කිරීම් | 06 | 00 | 01 | - |
| අධ්‍යයන නිවාඩු අවසන් වී රාජකාරියට වාර්තා කිරීම් | 02 | 00 | 01 | - |
| මරණ | 01 | 00 | 00 | - |

## 10 කාර්මණ්ඩල සංවර්ධනය

### 10.01 කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ සහ වැඩමුළු

#### 10.01.01 අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා

| වැඩමුළුව | දිනය | සම්පත් දායක |
|---|---|---|
| අධ්‍යයන කාර්යමණ්ඩල නිලධාරීන් සඳහා පර්යේෂණ (දෘශ්‍ය කලා පීඨය) | 2021.03.18 | මහාචාර්ය වලින්ද බෙනරගම / පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| අධ්‍යයන කාර්යමණ්ඩල නිලධාරීන් සඳහා පර්යේෂණ (නර්තන හා නාට්‍ය කලා පීඨය) | 2021.03.30 | මහාචාර්ය වලින්ද බෙනරගම / පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| අධ්‍යයන කාර්යමණ්ඩල නිලධාරීන් සඳහා පර්යේෂණ (සංගීත පීඨය) | 2021.03.31 | මහාචාර්ය වලින්ද බෙනරගම / පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| උසස් අධ්‍යාපනය සඳහා ඉගැන්වීමේ සහතිකපත්‍ර පාඨමාලාව (CTHE) | 2021.03.30 - 2021.09.17 | කථිකාචාර්යවරුන් මඬුල්ලක් |
| ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) | 2021.03.12 | මහාචාර්ය කොලින් එන් පීරිස්/ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය |
| ප්‍රතිපත්ති සහ අතුරු නීති වැඩිදියුණු කිරීම | 2021.06.17-2021.06.23 | මහාචාර්ය කොලින් එන් පීරිස්/ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය |
| ලොව පිළිගත් ශ්‍රේණිගත කිරීම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 2021.03.01 | මහාචාර්ය කොලින් එන් පීරිස්/ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය |

**10.01.02** අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා

| වැඩමුළුව | දිනය | සම්පත් දායක |
|---|---|---|
| අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා වැඩමුළුව | 2021.04.08 | ආචාර්ය රසික ප්‍රියංකර/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ සබරගමුව විශ්වවිද්‍යාලය |
| සියලුම තාක්ෂණික නිලධාරීන් සහ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන | 2021.08.31 | කථිකාචාර්යවරුන් මඩුල්ලක් |
| ගොනු කළමනාකරණය, මාර්ගගත සම්පත් සහ සේවා ඵලදායී ලෙස භාවිතා කිරීම | 2021.11.15 | සමන් ගිරාකඩුව මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී / සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණයේ මූලිකාංග | 2021.12.10 | ආචාර්ය අනූෂ ජයසිරි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය<br>කමනි සමරසිංහ මිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |
| අනධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණයේ මූලිකාංග | 2021.12.13 | ආචාර්ය අනූෂ ජයසිරි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය<br>කමනි සමරසිංහ මිය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය |

**10.02 විශ්වවිද්‍යාලයේ කාර්යමණ්ඩල සාමාජිකයින් සහභාගී වූ සම්මන්ත්‍රණ සහ පුහුණු වැසටහන්**

| වැඩමුළුව | දිනය |
|---|---|
| ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් සංවිධානය කරන ලද මාර්ගගත ඉගැන්වීම් ක්‍රම පිළිබඳ වැඩමුළුව | 2021 මැයි මස 7, 8, 14 සහ 15 යන දින |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් සේවාස්ථානයේ ඵලදායීතාව වැඩිදියුණු කරගැනීම | 2021 ඔක්තෝබර් මස 11, 18 සහ 25 යන දින |

## 10.03 විශ්වවිද්‍යාලයේ පුස්තකාල කාර්යමණ්ඩලය සහභාගී වූ සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන්

| අංකය | සම්මන්ත්‍රණ/ පුහුණු වැඩසටහන් | ආයතනය | කාර්යමණ්ඩලයේ වැඩසටහන් සඳහා සහභාගී වූ සාමාජිකයින් |
|---|---|---|---|
| 01 | නව සාමාන්‍යකරණය යටතේ පුස්තකාල සඳහා අභියෝග සහ අවස්ථා | ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය , කොළඹ විශ්වවිද්‍යාලය | පුස්තකාලයාධිකාරී |
| 02 | පුස්තකාල පර්යේෂණ පිළිබඳ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය | කොළඹ විශ්වවිද්‍යාලය | පුස්තකාලයාධිකාරී |
| 03 | වෙබ්අඩවි සංවර්ධනය පිළිබඳ දෙදින ධාරිතා සංවර්ධන වැසටහන | විශ්වවිද්‍යාල පුස්තකාලයාධිකාරී සංගමය | ජීඑම්එස් කුමාර, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඒවීඑම්කේ අංකුඹුර ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී |

## 11 යටිතල පහසුකම් පිළිබඳ විස්තර

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | (මුළු ඇස්තමේන්තුගත පිරිවැය( (රු.මි.) | 2021 වර්ෂාවසානයේදී වියදම (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|
| සංගීත පීඨය සහ පොදු පහසුකම් සඳහා ගොඩනැගිලි සංකීර්ණය | 775 | 143.97 | ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යය සැලකියයුතු අන්දමෙන් අවසන් කර 99% ක ප්‍රගතියක් අත්කරගෙන තිබේ. |
| දෘශ්‍ය කලා පීඨය සඳහා ගොඩනැගිල්ල සහ භූ නිර්මාණ සැලසුම් | 492 | 51.03 | ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යය සැලකියයුතු අන්දමෙන් අවසන් කර 98% ක ප්‍රගතියක් අත්කරගෙන තිබේ. |

## 12 පුස්තකාල ග්‍රන්ථ එකතුව පිළිබඳ සංසන්දනාත්මක තොරතුරු 2020/2021

| | 2020 | 2021 |
|---|---|---|
| කෘති එකතුව | 58122 | 58447 |
| වාරසඟරා එකතුව | - | 16 |
| නව පරිග්‍රහණ | 336 | 325 |

## 13 ක්‍රමෝපායික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

### 13.01 ක්‍රමෝපායික සැලැස්ම

2021-2023 සඳහා සකස් කළ ක්‍රමෝපාය සැලැස්ම 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක විය.

## 13.02 ක්‍රියාකාරී සැලැස්ම

2021 වර්ෂය සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම 2021-2023 වර්ෂය සඳහා ගැළපෙන පරිදි සකස් කර තිබේ. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කාර්තු වශයෙන් ප්‍රගති සමාලෝචන කටයුතු ඉටු කිරීම ප්‍රමාද විය.

නමුත්, පළවන, දෙවන සහ තෙවන කාර්තු හා සම්බන්ධ කාර්යයන්හි ප්‍රගතිය ක්‍රියාකාරී සැලැස්ම ලේඛනගත කරන ලද අතර 2021 වර්ෂය සඳහා ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සකසන ලදී. එය ක්‍රමෝපායික සැලසුම් කළමනාකරණ කමිටුව සහ පාලක සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත ය. 2022 වර්ෂය සඳහා ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම මේ වන විට සකස් කරමින් පවතින අතර එය තිරසර සංවර්ධන ඉලක්ක සමඟ සම්බන්ධ කිරීම ආරම්භ කර තිබේ.

## 14 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයෙහි කටයුතු

1. 2021 වර්ෂයේදී උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණයක් පැවැත්වීම.

2. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සඳහා වෘත්තීය මාර්ගෝපදේශන උපදේශකවරයෙකු බඳවාගැනීම.

3. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ ශිෂ්‍ය අත්පොත සකස් කිරීම සඳහා අදාළ කමිටුවක් පත්කිරීම.

4. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකයේ වෙබ් අඩවිය අලුතෙන් සැලසුම් කිරීම.

5. 2021 ශිෂ්‍ය අත්පොත සඳහා වෘත්තීය මාර්ගෝපදේශන තොරතුරු සංශෝධනය කිරීම.

## 15 තොරුතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

කොවිඩ් 19 වසංගත කාලසීමාව තුළ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය විසින් මාර්ගගත(Zoom) ටෙලිසන්නිවේදන මෘදුකාංගය සහ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය උපයෝගී කරගනිමින් 2018/2019 සහ 2019/2020 අධ්‍යයන වර්ෂයවල දේශන සාර්ථකව පැවැත්වීම සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලය, අධ්‍යයන සහායක කාර්යමණ්ඩලය සහ පීඨ තුනෙහි සියලුම විද්‍යාර්ථීන් සඳහා අවශ්‍ය පහසුකම් සලසන ලදී. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සමඟ සහයෝගීත්වයෙන් තාක්ෂණය උපයෝගී කරගනිමින් ඉගැන්වීම සිදුකරන ආකාරය සහ පරිගණක ඵලදායී ලෙස භාවිතා කරන ආකාරය පිළිබඳව කාර්යමණ්ඩල සාමාජිකයින් සඳහා වැඩමුළු කිහිපයක් පවත්වන ලදී. තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය පීඨ තුනෙහි නවක සිසුන් සඳහා නම්‍යකරණ වැඩසටහන් පැවැත්වීම සහ ජාතික සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ කිහිපයක් පැවැත්වීම සඳහා තාක්ෂණික සහාය සපයන ලදී. තවද රාජ්‍ය නාට්‍ය උළෙල, සංගීත භාණ්ඩ වාදනය පිළිබඳ ICTM අධ්‍යයන කණ්ඩායමේ 23 වන ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය, උපාධි අපේක්ෂක පර්යේෂණ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය - 2021, ISME තුන්වන දකුණු ආසියාතික කලාපීය සමුළුව, මාර්ගගත පර්යේෂණ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය 2021 (පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය) සඳහා ද තාක්ෂණික සහාය සපයන ලදී. එමෙන් ම පාලක සභාවේ, සනාතන සභාවේ, මුදල් කමිටුවේ, ප්‍රධාන ශිෂ්‍ය සංගම් රැස්වීමේ, නිවාඩු සහ ප්‍රදාන කමිටුවේ, විගණන කමිටුවේ රැස්වීම්, නීති අංශයේ විමසීම් සහ සම්මුඛ පරීක්ෂණ කිහිපයක් පැවැත්වීමට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය 2021 වර්ෂය පුරා අඛණ්ඩව සහයෝගය ලබා දෙන ලදී.

## 16 සී ද එස් කුලතිලක සංරක්ෂණ සහ පර්යේෂණ ඒකකයේ කටයුතු

| කාර්යය | දිනය |
| --- | --- |
| පරිකල්පනය<br>(පරිකල්පනය පිළිබඳ බුද්ධිමය සංවාදය) | 2021 පෙබරවාරි 06 |
| විද්‍යාර්ථීන් සඳහා තෙවන පර්යේෂණ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය | 2021 ජූලි 14 |
| විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය - නිබන්ධන 21 | 2021 ජූලි 14 |
| අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ දේශන මාලාව | 2021 ඔක්තෝබර් 29<br>( සම්පත් දායක - ආචාර්ය එල් ඩැනිස්ටර් පෙරේරා) |
| | 2021 දෙසැම්බර් 14<br>(සම්පත් දායක, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව) |
| සී. ද එස්. කුලතිලක අනුස්මරණ සම්මන්ත්‍රණය | 2021 දෙසැම්බර් 14 |
| සී. ද එස්. කුලතිලක සංරක්ෂණ සහ පර්යේෂණ ඒකකයේ පර්යේෂණ ජර්නලය ප්‍රකාශයට පත්කිරීම | 2021 දෙසැම්බර් 14 |
| සී. ද එස්. කුලතිලක සංරක්ෂණ සහ පර්යේෂණ ඒකකයේ කටයුතු - වෙබ් අඩවිය එළිදැක්වීම | 2021 දෙසැම්බර් 14 |



**සී.ද.ඒස්. කුලතිලක ලේඛනාගාරය සහ පර්යේෂණ ඒකකය මගින් ප්‍රකාශයට පත්කරන ලද පර්යේෂණ සඟරාව, ඒළිදැක්වීමේ උළෙලේ මුඛ්‍ය දේශනය පැවැත්වූ මහාචාර්ය රාජ් සෝමදේව.**

## 17 තත්ත්ව ආරක්ෂණ මධ්‍යස්ථානය

- සෑම පීඨයක් සඳහා ම ශිෂ්‍ය ප්‍රතිපෝෂණ ලබාගැනීමේ ආකෘතිපත්‍ර සකස් කරන ලදී.
- සම නිරීක්ෂණ ආකෘතිපත්‍රයක් සකස් කරන ලදී.
- සෞන්දර්ය කලා විශ්විද්‍යාලයේ ශිෂ්‍යයින් සඳහා මාර්ගගත ආචාරධර්ම පිළිබඳ උපදෙස් මාලාව
- විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක වන ප්‍රතිපත්ති/ අතුරු නීති/ අභිප්‍රාය ප්‍රකාශන ලැයිස්තුගත කර තිබේ. මීට අමතරව, ප්‍රතිපත්ති 33/ අතුරු නීති/ අභිප්‍රාය ප්‍රකාශන සැලසුම් කිරීමට යෝජනා කර තිබේ. ප්‍රතිපත්ති 33 න් ප්‍රතිපත්ති 21 සම්බන්ධයෙන් කමිටු පත්කර තත්ත්ව සහතික මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කර ඇති අතර ඒවායේ ප්‍රථම සමාලෝචනය අදාළ කණ්ඩායම් නායකයින් වෙත යොමු කර තිබේ.

- යෝජිත අධ්‍යාපනික සහ පරිපාලන ප්‍රතිපත්ති රාමුව පිළිබඳව කණ්ඩායම් නායකයින් සඳහා වැඩමුළු 2021.06.17 සහ 2021.06.23 පවත්වන ලදී.

- අරමුදල් උත්පාදන කමිටුව ස්ථාපනය කිරීම

- 2021 වර්ෂයේ දී තත්ත්ව ආරක්ෂණය සම්බන්ධයෙන් සනාතන සභාවේ ස්ථාවර කමිටුව විසින් පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව 10 කි.

## 18 ශාරීරික අධ්‍යාපන ඒකකයේ කටයුතු

1. දෘශ්‍ය කලා පීඨයේ නවක සිසුන් සඳහා ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ හඳුන්වාදීමේ නම්නීකරණ වැඩසටහන 2021.07.01 මාර්ගගත තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී.

2. 2021 සැප්තැම්බර් මස 19 සහ 20 දෙදින පැවති අන්තර්ජාතික විශ්වවිද්‍යාල ක්‍රීඩා දින සැමරුමට සිසුහු 20 දෙනෙක් මාර්ගගත තාක්ෂණය ඔස්සේ සහභාගී වූහ.

3. චෙස් (කාන්තා/ පිරිමි), තයිකොන්ඩෝ (කන්තා/ පිරිමි) සහ කරාතේ (කන්තා/ පිරිමි) ක්‍රීඩා සඳහා 2021 අන්තර් විශ්වවිද්‍යාල ශූරතාවලියට කණ්ඩායම් සහභාගී කරවන ලදී.

   I. මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද 2021.11.06 සහ 07 දෙදින පැවති චෙස් (කාන්තා සහ පිරිමි) තරඟ
   II. කැලණිය විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද 2021.11.11,12 සහ 13 දිනයන්හි පැවති තයිකොන්ඩෝ කාන්තා සහ පිරිමි තරඟ
   III. පේරාදෙණිය විශ්වවිද්‍යාලය සංවිධානය කරන ලද 2021.11.10 සිට 2021.11.26 ක්වා පැවැත්වුණු කරාටේ (කාන්තා සහ පිරිමි) තරඟ
      - කාන්තා කාණ්ඩයේ 04 වන මට්ටමේ කරාතේ තරඟය සඳහා ලෝකඩ පදක්කම - එස්.එම්.සමලිආරච්චි - දෘශ්‍ය කලා පීඨය

4. 2021.12.06 – 2021.12.09 දින දක්වා ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුව විසින් සංවිධානය කරන ලද සිව් දින පුහුණු වැඩසටහනට සිසුන් දෙදෙනෙක් සහභාගී වූහ.
   i. ඒ.ජී.එස්.එස්.ගුණසේකර – (DD/16/038)
   ii. එම්.ජී.කේ.එස්.කුමුලවීර – (MU/17/110)
   විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය

5. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා සංගමය විසින් සංවිධානය කරන ලද රැස්වීම්වලට සහභාගී විය.

6. ශාරික අධ්‍යාපන ඒකකය සඳහා මූල්‍ය ප්‍රතිපාදන සහ වෙනත් අවශ්‍ය තොරතුරු සැපයීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මාර්ගගත තාක්ෂණය ඔස්සේ ඔස්සේ පවත්වන ලද ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටු රැස්වීමට සහභාගී විය.

7. දෘශ්‍ය කලා පීඨයේ ශාරීරික අධ්‍යාපන කාර්යාලය දෘශ්‍ය කලා පීඨයේ සිට ඇල්බට් චන්ද්‍රවංශ පරිශ්‍රයේ පිහිටි නව ගොඩනැගිල්ල වෙත මාරු කරන ලද අතර ඇල්බට් චන්ද්‍රවංශ පරිශ්‍රයේ පිහිටි නව කායවර්ධන මධ්‍යස්ථානය (new strength hall) ප්‍රතිසැලසුම් කරන ලදී.

## 19 තොරුතුරු ඒකකය

විශ්වවිද්‍යාලය සම්බන්ධ තොරතුරු රැස්කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ ප්‍රමුඛ ආයතනයක් වශයෙන් තොරතුරු ඒකකය සේවය සලසයි.

කොවිඩ් 19 වසංගත කාලසීමාව තුළ විශ්වවිද්‍යාල වෙබ් අඩවිය ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරන ලදී. විශ්වවිද්‍යාල වෙබ් අඩවිය අභ්‍යන්තර පාර්ශව සහ බාහිර පාර්ශව වෙත තොරතුරු සැපයීමට විවිධ මොඩියුල වලින් සමන්විත වේ.

**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙහි ප්‍රධාන ක්ෂේත්‍ර**

**විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෙබ් අඩවිය** - විශ්වවිද්‍යාලයේ, එහි ඒකක සහ සේවා සම්බන්ධ ප්‍රධාන තොරතුරු මූලාශ්‍රය

අධ්‍යයන තොරතුරු සැපයීම සහ මාර්ගගත දේශන පැවැත්වීම සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය

**විද්‍යුත් ආකෘති පත්‍ර (E- forms)** :සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයින් සහ කාර්යමණ්ඩලය සඳහා විවිධ විද්‍යුත් ආකෘති සපයනු ලැබේ.

**මාර්ගගත ගෙවීම්:** ශිෂ්‍යයින්ට සහ වෙනත් පාර්ශවයන්ට ස්වකීය ගෙවීම් කටයුතු විශ්වවිද්‍යාල වෙබ් අඩවිය මඟින් සිදු කළ හැකිය.

**මාර්ගගත ශිෂ්‍ය ලියාපදිංචිය** : විශ්වවිද්‍යාලයේ ලියාපදිංචිවීම සඳහා ශිෂ්‍යයින්ට වෙබ් අඩවිය භාවිතා කළ හැකිය (වෙබ් අඩවිය මඟින් අවශ්‍ය ආකෘති ලබාගැනීම සහ බාරදීම සහ මාර්ගගතව ගෙවීම් සිදුකිරීම).

## 20 සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය

උසස් ගුණාත්මක බවකින් සහ දීර්ඝ කාලීන පැවැත්මකින් යුතු අධ්‍යයන ප්‍රකාශන සැපයීමෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යයන ප්‍රකාශන සම්බන්ධ අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා 2021 ජනවාරි මස 13 වන දින සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය ස්ථාපනය කරන ලදී.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය අධ්‍යාපනික සහ නිර්මාණාත්මක ලේඛන මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යයෙන් ප්‍රකාශයට පත්කිරීමට අදහස් කරගෙන සිටියි. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල මුද්‍රණාලය විසින් එම විශ්වවිද්‍යාලයේ මුද්‍රණ කටයුතු පමණක් නොව ශ්‍රී ලංකාවේ උගත් ප්‍රජාවෙහි සහ ලලිත කලා ක්ෂේත්‍රයන්හි මෙන් ම වෙනත් සම ක්ෂේත්‍රයන්හි තරුණ සහ පළපුරුදු වෘත්තිකයින්ගේ මුද්‍රණ කටයුතු සම්බන්ධයෙන් ද සහයෝගය දැක්වීමට ඉදිරිපත්ව සිටියි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මුද්‍රණාලය විසින් 2021 වර්ෂයේ දී සිංහල මාධ්‍යයෙන් ග්‍රන්ථ හතක් ප්‍රකාශය පත්කරන ලදී. තව ද සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල කළමනාකාරීත්වය විසින් නවතම ප්‍රකාශන 14 ක් නිකුත් කිරීමට අනුමැතිය ලබා දී තිබේ.

## 21 විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය (University Business Linkage Cell )

කර්මාන්ත ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව සෞන්දර්ය කලා ක්ෂේත්‍රයෙහි විශ්වවිද්‍යාලයීය නවෝත්පාදන වාණිජකරණය සඳහා පහසුකම් සැලසීමට විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය කටයුතු කරනු ලැබේ. උසස් අධ්‍යාපනයේ විකාශනය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ සහයෝගය සහිතව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 10/2016 යටතේ මෙම ඒකකය ස්ථාපනය කරන ලදී.

2021 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය අධ්‍යාපනයේ විකාශනය සහ සංවර්ධනය වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ (AHEAD) 03 වන පියවර, 4 වන පියවර (අවසන් අදියර) සඳහා ගමන් කිරීමට මණ්ඩලයේ ඇගයීම් සමාලෝචනය සහ ඉහළ නිර්දේශය සහිතව සාර්ථකව අවසන් කරන ලද අතර සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ තාක්ෂණික පැවරුම් වාණිජ්‍යකරණ කටයුතු සඳහා රුපියල් මිලියන 13 ක මුදලක් ලබා දෙන ලදී. විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය බහු ව්‍යාපෘතිවල නියැලෙන අතර ලංකා වාණිජ මණ්ඩලය, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සහ ළමා අරමුල් සංවිධානය සමඟ කාර්මික සහයෝගීතා ගිවිසුම් තුනක් අත්සන් කරන ලදී. මෙම මූලික කාර්යයන්හි ප්‍රමුඛ අරමුණ වන්නේ කාර්මික පැවරුම් වාණිජ්‍යකරණ ප්‍රයත්න සඳහා විශ්වවිද්‍යාල සහ අදාළ කාර්මික පාර්ශවයන් අතර සම්බන්ධය ශක්තිමත් කිරීමයි.

එමෙන් ම විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සෙරමික් අංශය විසින් කරන ලද නව නිෂ්පාදනයක් සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය සමඟ සම්බන්ධව ප්‍රථම වරට විශ්වවිද්‍යාල පේටන්ට් බලපත්‍රය ලබාගැනීම සඳහා අයදුම්පත් යොමු කිරීමට පහසුකම් සලසන ලදී. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය මඟින් බුද්ධිමය දේපළ සම්බන්ධයෙන් දැනුවත්ව සිටීම සහ වාණිජ්‍යකරණයේ නියැලීමට සැලසුම් කිරීම එම ඒකකය පසුකළ සුවිශේෂී සංධිස්ථානයකි.

විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ උප කුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (ආචාර්ය) රෝහන පී. මහලියනආරච්චි මහතාගේ ආරාධනයෙන් ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක AHEAD ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සී. උඩවත්ත මහතාගේ අනුග්‍රහය යටතේ “විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක වෙබ් අඩවිය සහ නිර්මාණාත්මක කලා ලේඛනගත කිරීමේ පද්ධතිය” එළිදක්වා තිබේ.

විශ්වවිද්‍යාල ව්‍යාපාරික සම්බන්ධක ඒකකය ව්‍යවසායකත්වය, බුද්ධිමය දේපළ සහ ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය වෙත අයදුම්පත් යොමුකිරීම පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීමට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ සිසුන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා වැඩමුළු කිහිපයක් සංවිධානය කරන ලද අතර ඉන්දියානු වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ ව්‍යාපාර, තොරතුරු, දැනුම, අධ්‍යාපන, මාර්ගගත ප්‍රදර්ශන සහ ලංකා වාණිජ්‍ය මණ්ඩලයේ විද්‍යුත් සහ තොරතුරු තාක්ෂණ උපකරණ සඳහා මාර්ගගත ප්‍රදර්ශනය ආදී වූ ජාතික සහ ජාත්‍යන්තර ප්‍රදර්ශන මඟින් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ නව නිෂ්පාදන ප්‍රදර්ශනය කරන ලදී.

ජනාධිපති හස්ත කර්මාන්ත සම්මාන උළෙලට සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ, සෙරමික් කලා අධ්‍යයනාංශයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශන භාණ්ඩ. මේ සඳහා ප්‍රථම ස්ථාන ඒකක්, දෙවන ස්ථාන දෙකක් සහ තෙවන ස්ථාන හිමි වූහ.



පළමු ස්ථානය - ගෘහ අලංකරණ බඳුන් යුගල



දෙවන ස්ථානය - ආර්ට් පොටරි



දෙවන ස්ථානය - කොළ පාට තේ කට්ටලය



තෙවන ස්ථානය - උද්‍යාන අලංකරණ මුහුණ

## 22 ජාත්‍යන්තර සබඳතා මධ්‍යස්ථානය

1. ජාත්‍යන්තර සහයෝගීතාවය හා සම්බන්ධ සියලුම කාර්යයන් සඳහා පහසුකම් සැපයීම සඳහා සෞන්දර්ය කලා **විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සහයෝගීතාවය පිළිබඳ ප්‍රතිපත්තිය හඳුන්වා දෙන ලදී.**

2. චක්‍රලේඛ උපදෙස් හා රෙගුලාසි වලට අනුකූලව වැඩිදියුණු කරන ලද අනුමැතිය ලබාදීමේ පරිපාටියේ පියවර දහය ඇතුළත්ව ජාත්‍යන්තර සහයෝගීතාවය ඇතිකරගැනීමේ දී අනුගමනය කළ යුතු පරිපාටිවල පැහැදිලිභාවයක් ඇතිකරන ලදී.

3. 2005 වර්ෂයේ සිට ජාත්‍යන්තර සහයෝගීතාවය සම්බන්ධ යාවත්කාල කරන ලද දත්ත සංචිතය සංවර්ධනය කරන ලදී.

4. 2021 වර්ෂයේ කොවිඩ් 19 වසංගතය හමුවේ අවස්ථා කිහිපයක දී පනවන ලද සීමා හේතුවෙන් භෞතික වශයෙන් සහයෝගීත්වය ඇතිකරගැනීමට අපොහොසත් විය. මාර්ගගත වේදිකාව භාවිතා කරමින් සාකච්ඡා පමණක් පැවැත්විණි.
    - Selcuk University, Konya-Turkey - Mevlana හුවමාරු ගිවිසුම් ලේඛනය
    - සීෂෙල්ස් කලා හා සැලසුම් නිර්මාණ ආයතනය - සීෂෙල්ස් අධ්‍යාපන සහ මානව සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින සීෂෙල්ස් කලා හා සැලසුම් නිර්මාණ ආයතනය අතර අවබෝධතා ගිවිසුම

5. ජාත්‍යන්තර සංස්කෘතික සයෝගීතාවය සඳහා පහසුකම් සැලසීමට ගොයිතෙ ආයතනයේ අධ්‍යක්ෂ ස්ටෙෆන් වින්ක්ලර් සමඟ Karlsruhe හි ZKM (කලා සහ මාධ්‍ය ආයතනය) සිට “ලෝක දේශපාලනයේ අර්බුධකාරී කලාප පිළිබඳ නිරීක්ෂණාගාර’ මැයෙන් සංචාරක ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

(ලෝකයේ අර්බුධකාරී කලාප ජාලය හා සම්බන්ධ වැඩමුළු, පර්යේෂණ සහ තවත් ක්‍රියාකාරකම් සඳහා මෙම ප්‍රදර්ශනය සම්පූර්ණයෙන් විවෘත විය).

6. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන අංශය සහ මැලේසියාවේ Universiti Teknologi Mara අතර අවබෝධතා ගිවිසුමකට එළඹීම සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා වන ක්‍රියාවලිය ආරම්භ කරන ලදී.

## 23 පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම – 2021

| | නම | 2021 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා |
|---|---|---|
| 01 | නදීශා වීරසිංහ මෙය කථිකාචාර්ය (පරිවාස) දෘශ්‍ය කලා පීඨය | 1. ගෝලීය අධ්‍යයන පර්යේෂණ ආයතනයේ ජාත්‍යන්තර සමුළුව<br>• වර්තමාන මෝස්තර වර්ණ නැඹුරුතා පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්<br>• රජගල ඓතිහාසික පුරාවිද්‍යා ක්ෂේත්‍රයෙන් ලබාගත් පබළු හා සම්බන්ධ සැලසුම් මූලධර්ම හා මූලිකාංග පිළිබඳ අධයයනයක්<br>2. අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව<br>• ශ්‍රී ලංකාවේ පාරම්පරික කින්නර ජන සමාජයේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ අධ්‍යයනයක් වර්ණ ගැන්වුම් ක්‍රියාවලිය ඇසුරෙන් )<br>• ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික රෙදිපිළි වර්ණ ගැන්වීම් ශිල්පයේ අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ අධ්‍යයනයක් |
| 02 | ආචාර්ය මනෝරංජන හේරත් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දෘශ්‍ය කලා පීඨය | 1. ජාතික පුරාවිද්‍යා ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය / 2021 ශ්‍රී ලංකාව<br>• පොළොන්නරුව තිවංක පිළිමගේ සිංහ රූප |

| | | |
|---|---|---|
| 03 | ආචාර්ය සමන් පනාපිටිය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>පීඨාධිපති/ සංගීත පීඨය | 1. ලෝක ඇමෙරිකානු ජාත්‍යන්තර විශ්වවිද්‍යාලය බංගලාදේශය<br>• මෙම ප්‍රසංගය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් නිර්මාණාත්මක ජන සංගීතාංග දෙකක් ඉදිරිපත් කරන ලදී.<br>2. ISME- දකුණු ආසියාතික කලාපීය සමුළුව - 2021 සංගීත පීඨය විසින් සංවිධානය කරන ලද දෙවන ජාත්‍යන්තර සුමුළුව<br>• ශ්‍රී ලංකාවේ උසස් සංගීත අධ්‍යාපනය පිළිබඳ ද්විමාන මණ්ඩල සාකච්ඡාව<br>3. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය 2021<br>• වසංගත රෝග සම්බන්ධයෙන් පුරාණ ශ්‍රී ලාංකිකයින්ගේ මහජන සෞඛ්‍ය<br>4. මාර්ගගත පර්යේෂණ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය - 2021 පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය/ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය<br>• මණ්ඩල සාමාජික සහ මණ්ඩල සමාලෝචක |
| 04 | ආචාර්ය ප්‍රියදර්ශනී පීරිස් පෙරේරා<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>සංගීත පීඨය | 1. සංගීතය, නර්තනය හා නාට්‍ය කලා පිළිබඳ ජාත්‍යන්තර සමුළුව - ප්‍රධාන දේශනය<br>• ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක කලා කර්මාන්ත හා එම අංශය සම්බන්ධයෙන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දායකත්වය<br>2. සංගීත අධ්‍යාපනය සඳහා ජාත්‍යන්තර සමාජය<br>• විශ්වවිද්‍යාලයේ සංගීත අධ්‍යයනයෙහි නිරත විද්‍යාර්ථීන්ගේ සංගීතමය ඉදිරිපත්කිරීම් වලදී භාවප්‍රකාශ වැඩිදියුණුකිරීම සඳහා EmoGraphics භාවිතයේ බලපෑම: පර්යේෂණාත්මක අධ්‍යයනයකි.<br>3. ජාත්‍යන්තර නිර්මාණාත්මක පදරචනය සහ සංස්කෘතික පියානෝ වාදනය ISME සමුළුව- "සංස්කෘතික රාමුව"<br>• ඒකල පියානෝ වාදනය - "ප්‍රශස්ති සහ වන්නම්" තේමාව නිර්මාණාත්මක ලෙස සංයෝජනය කර (Mash up ) ශ්‍රී ලාංකික සංස්කෘතිකමය සංයෝජිත නිර්මාණ<br>4. අන්තර්සංස්කෘතික පියානෝ අධ්‍යාපන ව්‍යාපෘතිය - ජර්මනිය<br>• වැඩමුළුවෙහි සාකච්ඡාව - ශ්‍රී ලංකාවේ සංගීත අධ්‍යාපන ක්‍රමයේ නව ප්‍රවණතා |

| | | |
|---|---|---|
| 05 | **අජන්තා නිරෝෂනී මිය**<br>**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**<br>**ඉංග්‍රීසි අධ්‍යයනාංශය** | 1. **අධ්‍යාපනය සහ ඉගැන්වීම පිළිබඳ දෙවන ගෝලීය සමුළුව**<br>• දකුණු ආසියාතික විශ්වවිද්‍යාල සිසුන්ගේ දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ලේඛනයේ දී මව් භාෂාවේ බලපෑම |
| 06 | **කමනි සමරසිංහ මිය**<br>**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**<br>තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 1. **විවෘත විශ්වවිද්‍යාලවල ආසියානු සංගමයේ 34 වන ජාතික සමුළුව**<br>• නිර්මාණාත්මක කලා අධ්‍යාපයනයේ දී ශිෂ්‍ය කේන්ද්‍රීයත්වය ප්‍රවර්ධනය කිරීම: පන්ති කාමරය තුළ න්‍යායාත්මක ඉගැන්වීමෙන් ඔබ්බට ගොස් ශිෂ්‍ය ක්‍රියාකාරකම් සිදුකිරීම සහ තාක්ෂණ සමෝධානික ඉගැන්වීම්වලින් සමන්විත වීම.<br>2. තිරසර උසස් පරිගණක අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICSAC 2021)<br>• කොවිඩ් 19 වසංගත කාලපරිච්ඡේදය තුළ නිර්මාණාත්මක කලා අධ්‍යාපන ප්‍රවේශයන් මාර්ගගතව සැපයීම සඳහා දුරස්ථ අධ්‍යාපන ප්‍රවේශ භාවිතය |
| 07 | **අජිත් වික්‍රමසිංහ මහතා**<br>**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය**<br>තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය | 1. කලා සහ මානව ශාස්ත්‍ර පිළිබඳ 8 වන සමුළුව (ICOAH 2021), මාර්ගගත සමුළුව<br>• ශ්‍රී ලංකාවේ ද්විමාන කෞතුක වස්තු සංරක්ෂණය සඳහා මියුරල් නිර්මාණ ඩිජිටල්කරණය<br>වික්‍රමසිංහ, ඒ., ජයසිරි ,ඒ., (2021).<br>2. විද්‍යාවේ අභිවර්ධනය උදෙසා වන ශ්‍රී ලංකා සංගමය (SLAAS 2021), මාර්ගගත සමුළුව<br>• ශ්‍රී ලංකාවේ ද්විමාන කෞතුක වස්තු සඳහා ඩිජිටල් ලේඛනාගාර නිර්මාණය කිරීම, වික්‍රමසිංහ, ඒ.ජයසිරි,ඒ. (2021).<br>3. මානව ශාස්ත්‍ර සහ සමාජවිද්‍යා පිළිබඳ 7 වන ජාතළන්තර සමුළුව (IConArts 2021), කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය<br>• සංරක්ෂණය සඳහා ද්විමාන කෞතුක භාණ්ඩ ඩිජිටල්කරණය සඳහා ප්‍රවේශය වික්‍රමසිංහ, ඒ.ජයසිරි,ඒ. (2021)<br>4. **නවෝත්පාදන හා නැඟී එන තාක්ෂණයයන් පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ වාර්තා සටහන්** (ICIET 2021),මාර්ගගත **සමුළුව, තාක්ෂණ පීඨය, ශ්‍රී** ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |

| | | |
|---|---|---|
| | | • මියුරල් නිර්මාණවල පරිදර්ශක මූර්තීන්හි සංඛ්‍යාන ආකෘතිය<br>වික්‍රමසිංහ, ඒ.ජයසිරි,ඒ. (2021)<br><br>5. මාර්ගගත පර්යේෂණ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය, 2021, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය<br>6.<br>• ශ්‍රී ලංකාවේ ද්විමාන කෞතුක වස්තු සංරක්ෂණය සම්බන්ධ ගැටලු සඳහා ඩිජිටල් තාක්ෂණය පදනම් කරගත් විසඳුම්<br>වික්‍රමසිංහ,ඒ., ජයසිරි, ඒ., කොඩිකාර, එන්., |
| 08 | **ඒ.ඒ.සී.ජේ. අදිකාරි**<br>**සහකාර ලේඛකාධිකාරී**<br>**නීති හා ප්‍රලේඛන** | **1. විද්‍යා හා මානව ශාස්ත්‍ර ක්ෂේත්‍රයේ දියුණුවීම් පිළිබඳ SLITT ජාත්‍යන්තර සමුළුව**<br><br>• මිථ්‍යාව හෝ යථාර්තය පිළිබඳ අනිවාර්ය බලය ලබාදීම; කොවිඩ් 19 වසංගත කාලපරිච්ඡේදය තුළ ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ අත්දැකීම් ආශ්‍රයෙන් විශ්ලේෂණය<br><br>2. ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ 18 වන ජාත්‍යන්තර සමුළුව - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>• ගෝලීය වසංගත කාලසීමාව තුළ බුද්ධිමය දේපළ අයිතීන් සුරැකීම සහ මහජන සෞඛ්‍ය දියුණු කිරීම: කොවිඩ් 19 වසංගතයට සම්බන්ධ වෛද්‍ය උපකරණ සම්බන්ධ ත්‍රිමාන මුද්‍රණ කටයුතු වැඩිවීමේ බලපෑම<br>**(ආචාර්ය සනත් විජේසිංහ සහ ඒ.ඒ.සී.ජේ. අදිකාරි, සමකතෘත්වය)** |
| 09 | **ඩී.පී. රෝහණ පීරිස් මහතා**<br>**කථිකාචාර්ය (පරිවාස)**<br>**නර්තන හා රංග කලා** | 1. **අස්පර්ශනීය සංස්කෘතික උරුමය පිළිබඳ 3වන ජාත්‍යන්තර සමුළුව** (ICICH) 2021, **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**<br><br>2. **ශ්‍රී ලාංකේය සංස්කෘතියේ භාවිත "ආයුබෝවන්" හා එහි ආචාර ධර්ම පිළිබඳ විමසුමක්**<br><br>**3. බහුශික්ෂණාත්මක ප්‍රවේශයන් පිළිබඳ 8වන ජාත්‍යන්තර සමුළුව** 2021- **ශ්‍රී ජයවර්ධනපුර විශ්විද්‍යාලය**<br>• පරිසරය හා තදානුබද්ධ වූ වෘක්ෂ විශ්වාස පිළිබඳ අධ්‍යයනය |

## 24 විගණන කමිටු වාර්තාව – 2021

### විගණන කමිටුමේ සංයුතිය සහ රැස්වීම්

පාලක සභාව සහ ලේඛකාධිකාරී විසින් පත්කරන ලද විගණන කමිටුව පාලක සභා සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

සමාලෝචිත වර්ෂය තුළදී පහත නිලධාරීන් විගණන කමිටුවේ සාමාජිකයින් වශයෙන් කටයුතු කරන ලදී:

### පාලක සභා සාමාජිකයින් -

| | | |
|---|---|---|
| ලක්ෂ්මන් අබේසේකර මහතා | - | සභාපති |
| මහාචාර්ය කුසුමා කරුණාරත්න | - | සාමාජික |
| මහාචාර්ය නිමල් කීර්ති දන්ගල්ල | - | සාමාජික |

### ලේඛකාධිකාරී -

| | | |
|---|---|---|
| බී.එම්.දයාවංශ මහතා | - | සාමාජික |

පී.එම්.ආර්.පතිරාජ මහතා, විගණන අධිකාරී, විගණන කමිටුවේ නිරීක්ෂක වශයෙන් කටයුතු කරන ලදී.

### ඉටු කරන ලද කාර්යයන්

1. සමාලෝචිත වර්ෂය සඳහා විගණන සැලැස්ම ක්‍රියාත්මක කරන ලදී.
2. ජාතික විගණන කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සහ නිරීක්ෂණ සම්බන්ධයෙන් එබඳු තත්ත්වයන් අනාගතයේ දී නැවත සිදු නොවන බව තහවුරු කරමින් අවශ්‍ය පියවර ගැනීම සඳහා වන නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ අඩංගු එක් එක් විමසුම හෝ නිරීක්ෂණ සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශ්වයන් විසින් ගනු ලැබූ/ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව කාලරාමුව සමඟ පරීක්ෂා කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරකම් සහ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ සමඟ සභාවට ඉදිරිපත් කරන ලදී.

## 25 තිරසර සංවර්ධනය පදනම් කරගත් අනාගත අපේක්ෂා පිළිබඳ වාර්තාව

තිරසර සංවර්ධනය පිළිබඳ න්‍යාපත්‍රය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යායපත්‍රය යටතේ තිරසර සංවර්ධන අභිමතාර්ථ 17 ක් පවතී. ඒ අනුව සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය විසින් සකසන ලද 2021-2023 ක්‍රමෝපායික සැලැස්මෙහි ඉලක්ක ඍජු හෝ වක්‍ර වශයෙන් තිරසර සංවර්ධන අභිමතාර්ථ සමඟ ගැලපේ.

විශ්වවිද්‍යාලය විසින් 2021-2023 ක්‍රමෝපායික සැලැස්මෙහි පහත දැක්වෙන ඉලක්ක **04 වන තිරසර සංවර්ධන අභිමතාර්ථය වන "ගුණාත්මක අධ්‍යාපනය"** ට ඍජුවම දායකත්වය සපයයි.

- ඉලක්ක අංක 1 - උපාධිධාරී රැකියා නියුක්තිය
- ඉලක්ක අංක 3 - නවෝත්පාදන සහ නිර්මාණාත්මක කටයුතු
- ඉලක්ක අංක 4 - ජාතික සහ ජාත්‍යන්තර දායකත්වය
- ඉලක්ක අංක 5 - මූල්‍යමය තිරසරභාවය
- ඉලක්ක අංක 6 - ජාත්‍යන්තර දෘෂ්ටිය

ඉලක්ක අංක 1, 3, 4, 5 සහ 6 සාක්ෂාත් කර ගැනීමෙන් සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට තිරසර සංවර්ධන ඉලක්ක අංක 04 මුදුන් පමුණුවා ගතහැකිය.

එමෙන් ම විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සාධාරණත්වය සහ සමානාත්මතාවය සඳහා වූ මධ්‍යස්ථානය බලගැන්වීමෙන් තිරසර සංවර්ධන අභිමතාර්ථ අංක. **04 වන ගුණාත්මක අධ්‍යාපනය** සහ අංක **05 වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය** සපුරාලීම සඳහා පිරිමි සහ ගැහැණු යන දෙඅංශයෙන්ම විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සමාන ප්‍රවේශයක් සහතික කරමින් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ සමානාත්මතාවය සහ ගුණාත්මකභාවය පවත්වා ගත හැකිය.

ගුණාත්මක අධ්‍යාපනය මඟින් උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය ඉහළ යාමෙන් **දිළිඳුභාවය පිළිබඳ තිරසර සංවර්ධන අභිමතාර්ථ අංක 01** සපුරාලීමෙන් විශ්වවිද්‍යාලයට දිළිඳුභාවය අවම කිරීම සඳහා වක්‍ර දායකත්වය සැපයිය හැකි වේ.

පර්යේෂණ ප්‍රකාශන උපුටා දැක්වීම් පිළිබඳ ඉලක්ක අංක 02, ජාතික හා ජාත්‍යන්තර දායකත්වය පිළිබඳ ඉලක්ක අංක 04 සහ ජාත්‍යන්තර ඉදිරි දැක්ම පිළිබඳ ඉලක්ක අංක 06 සාක්ෂාත් කර ගැනීමෙන් **සාමය, යුක්තිය සහ පූර්ණ ආයතන පිළිබඳ තිරසර සංවර්ධන අභිමතාර්ථ අංක 16** සහ **ඉලක්ක සඳහා ගෝලීය සහයෝගීතාවය පිළිබඳ තිරසාර සංවර්ධන අභිමතාර්ථ අංක 17** සාක්ෂාත් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල උපායමාර්ගික සැලැස්ම වක්‍රාකාරයෙන් දායකත්වය සපයනු ඇත.

ජාත්‍යන්තර දායකත්වය සහ මූල්‍ය තිරසරභාවය පිළිබඳ 04 වන සහ 05 වන ඉලක්ක පිළිවෙළින් ගෞරවනීය රැකියා හා ආර්ථික වර්ධනය පිළිබඳ **8 වන තිරසර සංවර්ධන ඉලක්කය** සපුරාලීමට වක්‍රාරයෙන් දායකත්වය සපයයි.

ඒ අනුව විශ්වවිද්‍යාලයේ 2021-2023 ක්‍රමෝපායික සැලැස්මේ සියලුම ඉලක්ක ඉහත සඳහන් තිරසර සංවර්ධන ඉලක්ක සමඟ ගැළපෙන ආකාරයෙන් සකස් කර තිබේ.

## සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති.

1. පොදු

### 1.1 වාර්තා කරණු ලබන ඒකකය.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයකි. ප්‍රධාන පරිපාලන කාර්යාලය සහ ප්‍රධාන මෙහෙයුම් පවත්වාගෙන යන ස්ථානය පිහිටුවා ඇත්තේ කොළඹ 7 ඇල්බට් වන්ද්‍රවංශයේ අංක 21 දරන ස්ථානයේය.

### 1.2 ප්‍රධාන කර්තව්‍යයන් සහ මෙහෙයුම් වල ස්වභාවය.

ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි මට්ටමින් සෞන්දර්ය අධ්‍යයන ක්ෂේත්‍රයේ න්‍යායාත්මක හා ප්‍රායෝගික අංශයන්ගෙන් උසස් අධ්‍යාපනය ලබාදීම, එම ක්ෂේත්‍රයේ දැනුම හා හැකියාවන් අන් අයට ලබාදීම සහ එම ක්ෂේත්‍රයේ පර්යේෂණ කටයුතුවල නියැලීම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සාර්ථකව නිමකරන විද්‍යාර්ථයින්ට උපාධි සහ සහතිකපත් ප්‍රදානය කිරීම ද විශ්වවිද්‍යාලයේ තවත් එක් ප්‍රධාන කාර්යභාරයකි.

### 1.3. නිකුත් කිරීම සඳහා බලය දීමේ දිනය

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2022 පෙබරවාරි මස 24 වන දින පාලක සභාවේ බලය ලැබී ඇත.

### 1.4 වාර්තාගත කාලච්ඡේදය.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලච්ඡේදය 2021 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වේ.

2. සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති අනුව අනුගත වේ. නමුදු ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත නොමැති අවස්ථා වලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය සහ සටහන් වලින් සමන්විත වේ.

### 2.2 ගණනය කිරීමේ පදනම.

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත. දේපල පිරියත හා උපකරණ සාධාරණ අගය පදනම් කර ගණනය කිරීම හැර මූල්‍ය ප්‍රකාශනවලට උද්ධමන සාධක ගැලපීම් සිදුකර නොමැත.

### 2.3 සංසංදනාත්මක සැසඳීම

ප්‍රවර්තන වර්ෂයේ වටිනාකම් ඉදිරිපත් කිරීමේදී විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරන ලද සියළුම ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූල වේ. අවශ්‍ය අවස්ථාවලදී සැසඳුම් අගයන් ප්‍රවර්තන වර්ෂයේ වෙනස්වීම් වලට ගලපා ඉදිරිපත් කර ඇත.

### 2.4 ප්‍රමාණාත්මක බව

සෑම ප්‍රමාණාත්මක හා සමාන අයිතම මූල්‍ය ප්‍රකාශන වල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන්නේ නම් හා එක සමාන නොවන ස්වභාවයේ අයිතම වෙන වෙනම ඉදිරිපත් කර ඇත.

### 2.5 හිලව් කිරීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවසරය දී ඇත්නම් මිස වත්කම් හා වගකීම් සහ ආදයම් හා වියදම් හිලව්කර කපා හැර නොමැත.

### 2.6 අඛණ්ඩ පැවැත්ම

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයට අඛණ්ඩ පැවැත්මක් ඇති බව සැලකිල්ලට ගෙන ඇත. සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පාලක සභාවට අපේක්ෂා කල හැකි ඉදිරි අනාගතයක් සඳහා ප්‍රමාණවත් සම්පත් පවතින බවට සාධාරණ අපේක්ෂාවක් ඇත. අනාගතය පිළිබඳ ඇති සියළු තොරතුරු සැලකිල්ලට ගනිමින් විශ්වවිද්‍යාලය ඈවරකිරීමක්, මෙහෙයුම් නවතා දැමීමක් පුරෝකථනය නොකරයි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මක් ඇත යන පදනම අනුගමනය කර ඇත.

### 2.7 ගිණුම්කරණ කාලච්ඡේදයෙන් පසු සිදුවීම්

ගිණුම්කරණ කාලච්ඡේදයට පසුව ඇති සියළුම ද්‍රව්‍යමය සිදුවීම් සලකා බලා ඇති අතර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය අවස්ථාවන් හිදී සුදුසු ගැලපීම් හා අනාවරණය කිරීම් සිදුකර ඇත.

### 2.8 ක්‍රියාකාරී හා වාර්තාකරණ මුදල් ඒකකය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර ඇති අයිතම මනිනු ලබන්නේ විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වන ආර්ථික පරිසරයේ භාවිතාකරන මුදල් වලිනි ( ව්‍යවහාරික මුදල් ) මෙම මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී හා වාර්ථාකරණ මුදල් **ඒකකය** වන ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කර ඉදිරිපත් කර ඇත.

### 2.9 විදේශ විනිමය වලින් කරන ලද ගනුදෙනු සහ ශේෂයන්

විදේශ විනිමය මගින් කරන ලද ගනුදෙනු දිනයන්හිදී පැවති විනිමය අනුපාත භාවිතා කරමින් ව්‍යවහාරික මුදල් පරිවර්තනය කර ඇත. එවැනි ගනුදෙනු නිරවුල් කිරීම මගින් ලැබෙන ලාභ සහ පාඩු මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වාර්තා කර ඇත.

### 2.10 ආසන්න අගයට වැටයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත මගින් අවසරය දී ඇති පරිදි වෙනත් අකාරයකින් දක්වා නොමැතිනම් මූල්‍ය ප්‍රකාශනවල ඇති මුදල් ආසන්නම රුපියලට වටයා ඇත.

### 2.11.1 දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ එහි පිරිවැය හෝ ප්‍රත්‍යාගණිත අගයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරන පාඩු අඩුකල අගයට පෙන්වා ඇත. පහත සඳහන් අනුපාතයන්ට අනුව සරල මාර්ග ක්‍රමයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1995.10.05 දින දරණ චක්‍රලේඛ අංක 649 ට අනුව ක්ෂය කරනු ලැබේ.

| වත්කම් ප්‍රභේදය | ක්ෂය අනුපාතය |
|---|---|
| ගොඩනැගිලි | 5% |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 10% |
| යන්ත්‍ර සහ පිරියත | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| පුස්තකාල පොත් හා වාරසඟරා | 20% |
| මෝටර් වාහන | 20% |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ (ක්‍රීඩා භාණ්ඩ ඇතුලුව) | 20% |
| උපාධි ලෝගු හා රංගවස්ත්‍රාභරණ | 20% |

## 2.11.2 <u>දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම</u>

දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති සමහර අයිතම අගයන් 2010.06.30 දිනට ප්‍රත්‍යාගණිත අගයට වේ.

<u>ඉඩම් හා ගොඩනැගිලි</u>

සියළු ඉඩම් ප්‍රත්‍යාගණන වටිනාකම් යටතේ දක්වා ඇත. වසර 10ට වැඩි සියළු ගොඩනැගිලි 2010.06.30 දිනට ප්‍රත්‍යගණන වටිනාකම් යටතේ දක්වා ඇත. ශ්‍රී ලංකා තක්සේරුකරුවන්ගේ ආයතනයේ ලියාපදිංචි තක්සේරුකරුවකු විසින් මෙම ප්‍රත්‍යගණනය කර ඇත. සාධාරණ අගය වෙළඳපල වටිනාකම මත තීරණය කර ඇත.

නේවාසිකාගාර 2ක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ආධාර ලෙස විශ්වවිද්‍යාලය වෙත ලැබෙන ලදී. මෙම වටිනාකම 2017 නොවැ.01 දින සිට ක්‍රමක්ෂය කිරීමට පටන්ගෙන ඇත.

<u>පොත්පත් හා වාර සඟරා</u>

2005.12.31 දිනට ප්‍රථම මිල දී ගත් පොත් පත් හා වාර සඟරා ප්‍රත්‍යගණන වටිනාකම් යටතේ දක්වා ඇත. ප්‍රත්‍යගණනය කරනු ලැබ ඇත්තේ පහත සඳහන් පදනම අනුව වේ.

| <u>පොත් පත් මිල දී ගත් කාල පරාසය</u> | <u>ප්‍රත්‍යගණන පදනම</u> |
|---|---|
| 01-01-1979 -31-12-2005 | 80% |
| 01-01-1990 -31-12-1998 | 70% |
| 1989-12-31 පෙර | 60% |

සුදුසුකම් ලත් ස්වාධීන උපදේශකවරයෙක් හා වරලත් ගණකාධිකාරිවරයෙක් එක් ව මෙම කාර්යය කරනු ලැබ ඇත.

<u>ලී බඩු සහ සවි කිරීම් පිරියත හා යන්ත්‍ර උපකරණ</u>

පිරිවැය හඳුනාගත හැකි අවස්ථාවල ලී බඩු සහ සවි කිරීම් පිරියත හා යන්ත්‍ර උපකරණ පහත සඳහන් පදනමට අනුව ප්‍රත්‍යගණනය කරනු ලැබ ඇත.

| <u>මිල දී ගත් කාල පරාසය</u> | <u>ප්‍රත්‍යගණන පදනම</u> |
|---|---|
| 1991-01-01 සිට 31-12-2000 | 80% |
| 31-12-1990 ට පෙර | 60% |

<u>කාර්‍යාල උපකරණ , විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ , උපාධි කබා සහ රංග වස්ත්‍ර</u>

කාර්යාල උපකරණ විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ සහ උපාධි කබා හා රංග වස්ත්‍ර පිරිවැය හඳුනාගත හැකි අවස්ථාවල පහත සඳහන් පදනමට අනුව ප්‍රත්‍යගණනය කරනු ලැබ ඇත.

| <u>මිල දී ගත් කාල පරාසය</u> | <u>ප්‍රත්‍යගණන පදනම</u> |
|---|---|
| 1996-01-01 සිට 2005-12-31 | 75% |
| 2005-12-31 ට ප්‍රථම | 50% |

පිරිවැය හඳුනාගත නොහැකි කාර්යාල උපකරණ විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ සහ උපාධි කබා සහ රංග වස්ත්‍ර ඇස්තමේන්තු ගත ශුද්ධ උපලබ්ධි වටිනාකම් අනුව සාධාරණ අගය මත ප්‍රත්‍යාගණනය කර ඇත. මෙම කාර්යය වරලත් ගණකාධිකාරිවරයෙකු සහ සුදුසුකම්ලත් ස්වාධීන උපදේශකවරයෙකු විසින් ඒකාබද්ධව කරනු ලැබ ඇත.

**මෝටර් වාහන**

සියලුම මෝටර් වාහන 2018.01.01 දිනට ප්‍රත්‍යාගණනය කරන ලද අගය වන රු. 27,400,000.00 ලෙස දක්වා තිබේ. සාධාරණ වටිණාකම් තක්සේරු කර ඇත්තේ වෙළඳපල වටිණාකම හා භෞතික පිරික්සුම පදනම් කර ගනිමිනි. සිලෝන් ඔටෝමොබයිල් ඇසෝශියේශන් (ලංකා මෝටර් රථ සංගමය) විසින් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී.

අංක WP KJ – 3863 දරන ටොයොටා ලෑන්ඩ් කෲස ප්‍රාඩෝ (2010) ජීප් රථය පරිත්‍යාගයක් ලෙස මුදල් සහ ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය වෙතින් ලැබී තිබුණි. පාලක සභාව මෙම රථය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය වෙත පැවරීම අනුමත කළ අතර එය විශ්වවිද්‍යාලීය ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කරන ලදී. ඒ අනුව ඔටෝමොබයිල් ඇසෝශියේශන් ඔෆ් සිලෝන් (ලංකාවේ මෝටර් රථ සංගමය) විසින් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදී. මෙම රථයේ අළුත්වැඩියා පිරිවැයද ඇතුළත් කරමින් එහි අගය රු. 11,580,089.37 ක් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර ඇත.

**2.11.3 සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් (ශුන්‍ය වටිණාකමැති වත්කම්)**

වත්කමක අවශේෂ වටිණාකම හා ප්‍රයෝජනවත් ආයුකාලය යටත් පිරිසෙයින් එක් එක් වාර්ෂික වාර්තා කිරීම් දිනයේදී සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අපේක්ෂණයන් පෙර ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම්, අදාළ වෙනස්කම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2011/03 හා 2014/03 මගින් විශ්වවිද්‍යාල පද්ධතියට අදාල කරන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් (SLPSAS) හි ප්‍රමිති අංක 7 හි ඡේද අංක 65 ප්‍රකාරව, ප්‍රමිති අංක 3-"ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් හා දෝෂ" අනුකූලව, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනසක් ලෙස දැක්විය යුතුය. විගණකාධිපතිවරයාගේ විස්තරාත්මක විගණන වාර්තාවේ ඡේද අංක 1.4.2-"ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති" යන කොටසෙහි සඳහන් කර ඇති අයුරින්, එම ප්‍රමිතිය ප්‍රකාරව, දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලය වාර්ෂිකව තක්සේරු නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස, ජංගම නොවන වත්කම්වල ප්‍රයෝජනවත් ආයුකාලයේ ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් මත ඇස්තමේන්තු දෝෂයක් ඇති වී තිබේ.

ඒ අනුව, ශුන්‍ය අගය සහිත ඒවාද ඇතුළු ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය ආරම්භ කරන ලද අතර 2021.12.31 දින වන විටත් ක්‍රියාත්මකව පැවතුණි. ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කෙරෙමින් පවතින බැවින්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) අංක 7 හි 91 ඡේදය ප්‍රකාරව 2021.12.31 දිනට රු. 513,808,196.10 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද ස්ථාවර වත්කම්වල සාරාංශයක් පහත අනාවරණය කෙරේ (ශුන්‍ය වටිණාකමැති වත්කම්වල විස්තරාත්මක ලැයිස්තුවක් පරිශිෂ්ට තුළ දී තිබේ)

| **ප්‍රභේද අංකය** | **වත්කම් ප්‍රභේදය** | **මුල් පිරිවැය රුපියල්** |
|---|---|---|
| 3 | කාර්යාලීය උපකරණ | 132,128,288.75 |
| 4 | පිරියත හා යන්ත්‍රෝපකරණ | 1,914,107.90 |
| 5 | විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 267,757,910.67 |
| 6 | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 49,237,612.10 |
| 7 | පුස්තකාල ග්‍රන්ථ | 46,483,730.28 |
| 9 | ක්‍රීඩා භාණ්ඩ | 1,191,767.00 |
| 14 | උපාධි ලෝගු සහ වස්ත්‍රාභරණ | 15,094,779.40 |
| | **එකතුව** | **513,888,196.10** |

**2.11.4** 2015, 2016 හා 2017 වර්ෂයන්හිදී ශුන්‍ය වටිණාකමැති වත්කම් සඳහා කරන ලද රු. 16,157,917.84 ක් වූ අධි-ප්‍රතිපාදනය 2018 වර්ෂයේ ගිණුම් පොත් තුළ පහත පරිදි ගැලපුම් කර තිබේ:-

| වත්කම් ප්‍රභේදය | ක්ෂය (රුපියල්) |
|---|---|
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරන | 10,760,353.72 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 805,316.93 |
| පුස්තකාල ග්‍රන්ථ හා වාර සඟරා | 874,428.14 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 21,995.45 |
| ගොඩනැගිලි | 194,260.66 |
| උපාධි ලෝගු සහ වස්ත්‍රාභරණ | 1,205,076.96 |
| කාර්යාලීය උපකරණ | 2,296,486.10 |
| | **16,157,917.84** |

ස්ථාවර වත්කම් ලේඛනය පරිගණකගත පැකේජ දෙකක් තුළ පවත්වා ගෙන ගොස් තිබේ. ස්ථාවර වත්කම් දත්ත 2015 වර්ෂය දක්වා එක් පැකේජයක් (පැරණි පැකේජය) තුළද, 2016 වර්ෂයේ සිට ඉදිරියට නව පැකේජය තුළද ලේඛනගත කර ඇත. පැරණි පැකේජයේ සියලුම දත්ත 2018 වර්ෂය තුළ නව පැකේජයට අන්තර්ග්‍රහණය කර ඇති අතර පැකේජය පැරණිතම මිලදී ගත් දිනයේ සිට ක්‍රියාත්මක කර ඇත. මෙයද ඉහත සඳහන් කරන ලද ක්ෂය අධි-ප්‍රතිපාදනය සඳහා බලපෑම් ඇති වී තිබේ.

**2.11.5** ක්‍රීඩා භාණ්ඩවල පිරිවැයෙහි වටිණාකම වන රු. 714,167/- ක අගය 'කාර්යාලීය උපකරණ' වෙතින් 'ක්‍රීඩා භාණ්ඩ' වෙත මාරු කරනු ලැබූ අතර, ක්‍රීඩා භාණ්ඩවල සමුච්චිත ක්ෂය 'කාර්යාලීය උපකරණවල සමුච්චිත ක්ෂය' වෙතින් 'ක්‍රීඩා භාණ්ඩවල සමුච්චිත වටිණාකම' වෙත මාරු කරන ලදී.

2.11.6 <u>කොහුවල පරිශ්‍රය</u>

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල ට අයත් කොහුවල පිහිටි පරිශ්‍රයක් තාවකාලිකව සිය අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාම සඳහා භාවිතයට ගනිමින් සිටී. මෙම විශ්වවිද්‍යාලයේ පවත්නා ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් එසේ කරනු ලබයි. මෙම තත්වය යටතේ මෙම පරිශ්‍රයේ වටිනාකම විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශ වල දක්වා නොමැත.

2.12 <u>කෙරීගෙන යන වැඩ (ප්‍රාග්ධන)</u>

වාර්තා කරන දිනට සම්පූර්ණ නොකරන ලද දේපල පිරියත හා උපකරණ සඳහා වන ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන වැඩ මූලධන ලෙස දැක්වේ. කෙරීගෙන යන වැඩ මත දරන ලද පිරිවැය භාවියතට ගන්නා විට දේපල පිරියත හා උපකරණ වෙත මාරු කරනු ලැබේ.

2.13 <u>අස්පෘශ්‍ය වත්කම්</u>

පිරිවැය නිශ්චිතව මැනිය හැකි පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ඇත. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් පිරිවැයෙන් සමුච්චිත ක්‍රමක්ෂය අඩු කර දක්වනු ලැබේ. මෙම පිරිවැය ඵලදායී ජීව කාලය තුල ක්‍රමක්ෂය කරනු ලැබේ.

2.14 <u>මූල්‍ය වත්කම්</u>

<u>ආයෝජන</u>

ස්ථාවර තැන්පතු ආයෝජන මගින් නිරූපනය කරයි. මෙම ආයෝජනයන් "ආයෝජන" මූල්‍ය වාර්තා කරන ප්‍රමිති 09 ට අනුව ගිණුම්ගතකර ඇත.

**2.15 <u>ජංගම වත්කම්</u>**

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් යනු විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල වර්ෂය තුලදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන හෝ උපයෝජනය වෙතැයි අපේක්ෂා කරන ඒවා වන අතර, වාර්තා කරන දිනයේ සිට මාස දොළහක් සිදුවන සිදුවීම් වේ.

2.16 <u>තොග</u>

ඉන්වෙන්ටරි පිරිවැය ප්‍රකාශ කර ඇති අතර පළමුවෙන් පිටතට (FIFO) පදනම මත තීරණය වේ. ඉන්වෙන්ටරි ප්‍රධාන වශයෙන් ලිපි ද්‍රව්‍ය සහ අමතර කොටස් වලින් සමන්විත වේ. ඉන්වෙන්ටරි ඇත්තේ පරිභෝජනය සඳහා මිස නැවත විකිණීම සඳහා නොවේ.

ඉන්වෙන්ටරි අයිතමවල සෙමින් චලනය වන අයිතම (උදා: පොත්) රු. 1,180,352.03 ක් සහ චලනය නොවන අයිතම රු. 289,277.54 ක් ඇතුළත් වේ. රුපියල්. 2022 දී වටිනා භාණ්ඩ 191,839.54 පරිත්‍යාග කර ඉවත දමනු ලැබේ.

නඩත්තු අංශයේ ඉන්වෙන්ටරි වෙන වෙනම ගණනය කෙරේ.

VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලය – පොත් තොගයට ඇතුළත් වේ (පොත් 20ක් සිංහල වන්නම් කලාවෙන් ලැබිය යුතුය) .

ප්‍රධාන වෙළඳසැල් වලින් නිකුත් කරන ලද පොත් VAPA විශ්ව විද්‍යාල මුද්‍රණාලයෙන් ලබා ගත හැකිය හෝ බෙදාහරින්නන් වෙත යවා ඇති මුදල රුපියල් 555,101.53 කි.

2.17 <u>සේවකයන්ට ලබා දුන් අත්තිකාරම් හා ලැබිය යුතු දේ.</u>

සේවකයන්ට ලබාදුන් අත්තිකාරම් හා ලැබිය යුතු ශේෂය උත්සව අත්තිකාරම් හා පොත් සඳහා වන දීමනාවෙන් සමන්විත වේ.

**2.18 <u>මුදල් හා මුදල් සමාන දේ.</u>**

මුදල් හා මුදල් සමාන දේ මගින් නිරූපණය වන්නේ ජංගම ගිණුම් ශේෂය සහ ඉතුරුකිරීමේ ගිණුම් වල ශේෂයන් වේ. අතේ ඇති මුදල්, හා කෙටිකාලීන ඉහල ද්‍රවශීලී ආයෝජන එනම් පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කල හැකි අතර වටිනාකම සුළු අවධානමකට යටත් දේ වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා මුදල් හා මුදල් සමාන ද්‍ර යන්නට අතැති මුදල් හා බැංකුවේ ඇති තැන්පතු ද අදල වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කරනු ලබන්නේ වක්‍ර ක්‍රමය මත පදනම්වය.

2.19 <u>සේවක ප්‍රතිලාභ</u>

<u>පාරිතෝෂික සඳහා වෙන් කිරීම</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක LKAS 19 පරිදි වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන සියළු සේවක භවතුන් වෙනුවෙන් විශ්‍රාමික පාරිතෝෂිත සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ. මෙම වෙන් කිරීම් බාහිර අරමුදලක ආයෝජනය කර නොමැත.

2019.06.01 දින සිට බලපැවැත්වෙන පරිදි නිකුත් කරන ලද කොමිෂන් සභා චක්‍රලේඛ 05/2019 අනුව පාරිතෝෂික වෙන්කිරීම් පසුගිය වසර වලට සාපේක්ෂව විශාල ලෙස ඉහල ගොස් තිබේ. ඒ අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ගෙවනු ලබන අධ්‍යයන දීමනාව සහ විශ්වවිද්‍යාල පද්ධතියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන මාසික වන්දි දීමනාව (MCA) පාරිතෝෂික වෙන් කිරීම් ගණනය කිරීම සඳහා සලකා බලන ලදී.

## 2.20 වගකීම් සහ වෙන්කිරීම්

### ජංගම වගකීම්

ජංගම වගකීම් ඒවායේ පොත් අගයට සඳහන් කර ඇත.

### වෙන් කිරීම්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට ඇති වර්තමාන බැඳීම් (නෛතික) පවතින අවස්ථාවන්හිදී වෙන් කිරීම් හඳුනාගෙන වාර්ථා කර ඇත.

### අවිනිශ්චිත වගකීම් හා අවිනිශ්චිත වත්කම්

අවිනිශ්චිත වගකීමක් යනු ක්‍රියාදමයේ පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් මත සිදුවන සිදුවීම හඳුනා නොගත් වර්තමාන වගකීම් වන අතීත සිදුවීම් වලින් පැනනැගිය හැකි සිදුවීමකි. වගකීම පියවීම සඳහා සම්පත් ගලා ඒමක් අවශ්‍ය වනු ඇත.

නිශ්චිතව මැනිය නොහැකි වගකීම් ඇති අවස්ථාවන්හිදී අඛණ්ඩව වගකීමක් ලෙස හඳුනා නොගන්නා අතර මූල්‍ය ප්‍රකාශනයේ එහි පැවැත්ම හෙළිදරව් කරයි.

අවිනිශ්චිත වත්කමක් යනු විශ්වවිද්‍යාල පාලනයෙන් ඔබ්බට ගිය අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ වැඩි ගණනක් සිදුවීම හෝ සිදුවීම් වලින් පැන නැගිය හැකි වත්කමකි. විශ්වවිද්‍යාලයේ අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා අතර, නිශ්චිත නොවන එහි පැවැත්ම අනාවරණය කරයි.

## 2.21 ආදායම් හඳුනාගැනීම

රජයේ පුනරාවර්ථන ආධාර මුදල් පදනම් මත ගිණුම් ගත කෙරේ. ශිෂ්‍යයින් ගෙන් අය කරනු ලබන පාඨමාලා ගාස්තු ඒවා එකතු කරන අවස්ථාවේ දි ගිණුම් ගත කෙරේ. ආයෝජන කටයුතු මත ආදායම් උපචිත පදනම මත ගිණුම්ගත කර ඇත. ස්වයං මූල්‍ය පදනම මත පවත්වාගෙන යනු ලබන පාඨමාලා වෙනුවෙන් ශිෂ්‍යන්ගෙන් අයකරනු ලබන පාඨමාලා ගාස්තු අදල පරිදි මූල්‍ය ප්‍රකාශ වල පාඨමාලා කාලය පදනම් කර ගෙන විලම්භනය කරනු ලැබේ.

### මූල්‍ය ආදායම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත නොමැතිවීම හේතුවෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 අනුව පොලී අනුපාතය භාවිතා කරමින් පොළී ආදායම උපචිත පදනම මත හඳුනා ගැනේ.

## 2.22 වියදම් හඳුනා ගැනීම

මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ දැක්වෙන වියදම් එකී වියදම් වල ස්වභාවය පදනම් කරගෙන වෙන වෙනම දක්වා ඇත. වසරේ අතිරික්තය ගණනය කිරිමේ දි ප්‍රථම උපාධි අපේක්ෂකයින් වෙනුවෙන් දරණ ලද සියළු වියදම් රජයේ පුනරාවර්ථන ආධාර වලින් අඩුකර පෙන්වා ඇත.

## 2.23 **විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය (CODL)**

විශ්ව විද්‍යාලය "විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය - CODL" නමින් හැඳින්වෙන වෙනම ඒකකයක් තනිකරම ස්වයං මූල්‍ය පදනමක් මත පවත්වාගෙන යයි. මෙම ඒකකය සඳහා වෙනම මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන අතර ඉන් අනතුරුව ඒවා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කෙරේ.
කොමිෂන් සභා චක්‍රලේඛ 932 අනුව, CODL අරමුදල භාවිතා කිරීම සඳහා CODL විසින් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර ඇත. ඒ සඳහා අරමුදල් වියදම් ප්‍රමාණය අරමුදල් ආදායම් ගිණුමට මාරු කරනු ලැබේ. වසර තුළ අරමුදල් වියදම් රු. 488,338.00 කි

ප්‍රධාන වශයෙන් මෙම වැඩසටහන් ප්‍රායෝගික නැඹුරු ක්‍රියාකාරකම් ඇතුළත් වේ. වසංගත තත්ත්වය හේතුවෙන් අධ්‍යයන කටයුතු (විභාග සහ ඉගැන්වීම්) කිරීමට නොහැකි විය. සිසුන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීමට සුදුසු තත්ත්වයට පත්වීමෙන් පසු මේ සියලු කටයුතු සිදු කළ යුතු වේ. ඒ නිසා සියලු ආදායම විලම්බිත කර ඇත්තේ දරන ලද වියදම් අඩු කිරීමෙන් පසුවය.

**2.24 පශ්චාද් උපාධි අධ්‍යයන ඒකකය**

ස්වයං මූල්‍ය පදනම මත පශ්චාද් උපාධි අධ්‍යයන ඒකකය වශයෙන් වෙනම ඒකකයක් විශ්වවිද්‍යාලය මඟින් පවත්වාගෙන යනු ලැබේ. මෙම ඒකකය වෙනුවෙන් වෙනම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර පසුව එය විශ්වවිද්‍යාලයේ සමස්ත මූල්‍ය ප්‍රකාශ හා ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශවල පෙන්වා ඇත.

**2.26 මූලධන / සංවර්ධන ආධාර යටතේ ලද විශේෂ ආධාර ගිණුම්ගත කිරීම.**

මහා භාණ්ඩාගාරයෙන් විශේෂ ව්‍යාපෘති සඳහා ලැබෙන මූලධන මූල්‍ය ප්‍රතිපාදන ප්‍රථමයෙන් වැය නොවූ මූලධන ආධාර යටතේ ගිණුම් ගත කෙරේ. මෙම මුදල් වලින් පුනරාවර්තන ස්වභාවයේ කටයුතු සඳහා වැය කරන විට එම මුදල් මූල්‍ය කාර්ය සාධන වාර්තාවේ පුනරාවර්තන වියදම් සේ දක්වනු ලබයි.

**2.27 ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා ලැබෙන මූලධන ආධාර ගිණුම් ගත කිරීම.**

මූලධන වියදම් සේ සැලකිය හැකි වියදම් පමණක් ප්‍රාග්ධනිත කරනු ලබන අතර අනෙකුත් වියදම් මූල්‍ය කාර්ය සාධක වාර්තාවේ වියදම් ලෙස දක්වා ඇත.

**2.28 සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ හෙළිදරව් කිරීම.**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මග පෙන්වීම යටතේ ප්‍රතිපත්තියක් ලෙස විශ්වවිද්‍යාලය සඳහා අන්තර්ජාල පහසුකම් LEARN ආයතනයෙන් ලබා ගනිමින් පවතී.

අප විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරියක වන අයි.ඒ.කේ.සී. සමරසිංහ මහත්මිය LEARN සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස කටයුතු කරමින් සිටී.එම කථිකාචාර්යවරිය විසින් මෙම සමාගමට සපයන සේවය වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් හෝ එම සමාගම විසින් කිසිදු පාරිශ්‍රමිකයක් ගෙවනු නොලැබේ.

**2.30 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 (SLPSAS 2) ට අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇති අතර එමගින් මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් හා ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් ලැබීම් හා ගෙවීම් නිරූපනය වේ. මුදල් හා මුදල් සමාන දෑ යන්නට ජංගම ගිණුම් හා ඉතිරිකිරීමේ ගිණුම් වල ශේෂයන් ඇතුලත් වේ.

**2.31 ඉඩම් අයිතිය පිළිබඳ විස්තර**

| ඉඩම | වත්මන් තත්වය |
|---|---|
| අංක 21 ඇල්බට් චන්ද්‍රවංකය | 2017 අප්‍රේල් මස 27 වන දින, රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ, ප්‍රදන අංක 4/10/41274 යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගෙන ඇත. |
| අංක 21/1 ඇල්බට් චන්ද්‍රවංකය | 2013 නොවැම්බර් 19 වන දින රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ, ප්‍රදන අංක 4/3/9908 යටතේ විශ්වවිද්‍යාලය විසින් අත්පත් කරගෙන ඇත. |
| අංක 46, හෝටන් පෙදෙස | රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ විශ්වවිද්‍යාලය අත්පත් කරගැනීමට කටයුතු කරගෙන යනුලැබේ. |
| අංක 146 අනගාරික ධර්මපාල මාවත,දෙහිවල | රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ විශ්වවිද්‍යාලය අත්පත් කරගැනීමට කටයුතු කරගෙන යනුලැබේ. |
| අංක 137 වලව්වත්ත,රාජගිරිය | රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 06 වන කොටස යටතේ විශ්වවිද්‍යාලය අත්පත් කරගැනීමට කටයුතු කරගෙන යනුලැබේ. |

2.32

<u>ශිෂ්‍යත්ව කඩකිරීම පිළිබඳ විස්තර</u>

නම: එස්. එම්. කෝට්ටේගොඩ මහතා
අයකරගත යුතු මුදල: රු. 3,470,737.17
අර්ථසාධක අරමුදල් ශේෂය: රු. 921,487.22 කි
වත්මන් තත්ත්වය: 2020.09.29 දින බේරුම්කරණය දැනුම් දී ඇති අතර UPF ආපසු ගෙවීම සඳහා UPF මුදල් ආපසු ගෙවීමේ අයදුම්පත හෝ එකඟ වූ පරිදි වාරික ගෙවා නොමැත.

නම: පී.කේ.ඩබ්.එම්. විජේගුණසේකර මිය
අයකරගත යුතු මුදල: රු.1,271,568.00
අර්ථසාධක අරමුදල් ශේෂය: රු. 148,438.31 කි
වත්මන් තත්ත්වය: DMR/1853/2019 යටතේ කොළඹ දිසා අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති අතර ප්‍රධාන ණයගැතිවරයා විසින් බේරුම්කරණයක් යෝජනා කර අනුමැතිය සඳහා 2020.12.17 දින පැවති 178 වැනි විශ්වවිද්‍යාල පාලක සභාව වෙත යොමු කර ඇත.

නම: . කේ.ඒ.කේ.පී.එස්. බණ්ඩාර මහත්මිය - දුරකථන ක්‍රියාකරු සහ පිළිගැනීමේ නිලධාරිනිය
අයකරගත යුතු මුදල: රු.764,394.10
වත්මන් තත්ත්වය: K. A. K. P. S. බණ්ඩාර මහත්මිය සේවය අතහැර ගියා ලෙස සහ බැඳුම්කරය කඩ කළ ලෙස සැලකේ. එබැවින් ඇයගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂයෙන් නියමිත මුදල අඩුකර ගැනීමට ඇය කැමැත්ත දී ඇත.

2.33 <u>වෙනත්</u>

2.33.01

නම: ඩබ්ලිව් කේ ජේ පෙරේරා මහතා – කාර්යාල සහයක – අනධ්‍යයන ආයතනය
අයකරගත යුතු මුදල: රු.173,121.00
ඩබ්ලිව්.කේ.ජේ.පෙරේරා මහතා ව්‍යාජ ලේඛන භාවිතා කොට අතිකාල ලබාගෙන ඇති බැවින් ඔහු සේවයෙන් පහකර ඇත. ඔහුගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ශේෂයෙන් සහ පාරිතෝෂිකයෙන් නියමිත මුදල අඩුකර ගැනීමට ඔහු කැමැත්ත දී ඇත.

2.33.02

180 වැනි විශ්වවිද්‍යාල පාලක සභා රැස්වීම් අනුමැතිය ඇතිව ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක කටයුතු පිළිබඳ මුද්‍රිත පොත් ප්‍රකාශයට පත් කිරීම සඳහා "VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලය" නමින් වෙනම ඒකකයක් ස්ථාපිත කර ඇත.
VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලය මගින් පොත් කිහිපයක් මුද්‍රණය කර ඇති අතර මුද්‍රිත පොත් තොගය විශ්වවිද්‍යාල ගබඩාව වෙත ලැබී ඇත. "VAPA මුද්‍රණාලය" ගිණුමේ ගනුදෙනු සටහන් කර ඇති අතර මුද්‍රිත පොත්වල ශේෂය ඉන්වෙන්ටරිය යටතේ දැක්වේ. 2022 වර්ෂයේදී VAPA විශ්වවිද්‍යාල මුද්‍රණාලයේ ගණුදෙණු වෙනම ගිණුම් කට්ටලයක සටහන් කිරීමට සැලසුම් කර ඇත. ආරම්භක ප්‍රාග්ධන මුදල රුපියල් 2,000,000.00 VAPA මුද්‍රණාලයෙන් ලැබිය යුතුය.

2.33.03

VAPA TV නාලිකාව 2022 දී දියත් කිරීමට සැලසුම් කර ඇත.

# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
# මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය
# (2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා)

| | සටහන් | රු. 2021 | රු. 2020 |
|---|---|---|---|
| **ආදායම** | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | | 1,113,000,000 | 1,063,000,000 |
| රජයේ ප්‍රදාන - මූලධන | | 4,610,584 | 10,851,803 |
| උපයන ලද ආදායම | | 12,303,250 | 9,375,358 |
| රාජ්‍ය ප්‍රදාන ක්‍රමක්ෂය | | 187,311,108 | 200,151,316 |
| ප්‍රදාන - මහපොල | | - | - |
| ප්‍රදාන - ශිෂ්‍යාධාර | | 26,204,000 | 10,215,700 |
| | | **1,343,428,942** | **1,293,594,177** |
| ආදායම - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | | 1,532,019 | 2,390,047 |
| ආදායම - විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය | | 4,171,818 | 9,385,993 |
| **මුළු ආදායම** | | **1,349,132,779** | **1,305,370,218** |
| **වියදම** | | | |
| සේවක පඩිනඩි | 3.01 | 893,364,644 | 876,936,705 |
| ගමන් ගාස්තු | 3.02 | 241,127 | 281,226 |
| සැපයුම් | 4 | 13,814,046 | 13,635,989 |
| නඩත්තු | 5 | 16,452,053 | 9,648,571 |
| ගිවිසුම්ගත සේවා | 6 | 133,380,734 | 108,035,977 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 7 | 28,061,286 | 25,835,835 |
| මහපොල ශිෂ්‍යත්ව | 8.1 | - | - |
| ශිෂ්‍යාධාර | 8.2 | 26,204,000 | 10,215,700 |
| ප්‍රදාන පුනරාවර්තන වියදම | | 4,667,084 | 10,851,803 |
| ප්‍රයෝජනයට ගතනොහැකි ස්ථාවර වත්කම් බැහැර කිරීමේ අලාභය | | - | 211,886 |
| පාරිතෝෂික | | (62,698,941) | 108,211,505 |
| ක්ෂය හා ක්‍රමක්ෂය | | 187,311,108 | 200,151,316 |
| | | **1,240,797,141** | **1,364,016,512** |
| වියදම - පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | | 1,082,373 | 2,202,925 |
| වියදම - විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය | | 1,665,769 | 3,174,280 |
| **මුළු වියදම** | | **1,243,545,284** | **1,369,393,717** |
| වර්ෂය සඳහා අතිරික්තය / (ඌනතාවය) - විශ්වවිද්‍යාලය | | 103,049,662 | (70,422,335) |
| වර්ෂය සඳහා අතිරික්තය / (ඌනතාවය) - පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | | 449,646 | 107,955 |
| වර්ෂය සඳහා අතිරික්තය / (ඌනතාවය) - විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය | | 2,506,049 | 5,589,326 |
| වර්ෂය සඳහා මුළු අතිරික්තය / (ඌනතාවය) | | **106,005,357** | **(64,725,054)** |

**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**
**2021.12.31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | සටහන් | 2021 | 2020 |
|---|---|---|---|
| | | රු. | රු. |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 12 | 55,353,929 | 17,592,262 |
| ලැබිය යුතු | 13 | 19,235,057 | 17,895,465 |
| කෙටිකාලීන ආයෝජන (විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය ) | | 39,905,996 | 36,965,361 |
| තොග | 14 | 9,284,788 | 6,283,635 |
| ඉදිරියට කල ගෙවීම් | 15 | 641,129 | 1,007,249 |
| අත්තිකාරම් | 16 | 10,320 | 60,150 |
| කාර්ය මණ්ඩලය සඳහා ණය හා අත්තිකාරම් | 18 | 52,432,002 | 50,317,302 |
| බාහිර පාර්ශ්වයන්හි තැන්පතු | 19 | 353,594 | 221,707 |
| | | **177,216,814** | **130,343,132** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ආයෝජන | 20 | 5,304,162 | 6,347,545 |
| දේපළ පිරියත හා උපකරණ | 10 | 3,837,385,543 | 3,976,796,587 |
| අස්පෘශ්‍ය වත්කම් | 11 | 3,752,666 | 67,491 |
| කෙරීගෙනයන වැඩ ප්‍රාග්ධන | 17,21 | 914,826,559 | 701,331,888 |
| | | **4,761,268,930** | **4,684,543,511** |
| **මුළු වත්කම්** | | **4,938,485,745** | **4,814,886,643** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | 22 | 14,856,451 | 36,706,111 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 23 | 46,088,225 | 35,042,907 |
| තැන්පතු හා රඳවා ගැනීම් | 25 | 68,228,632 | 84,638,159 |
| කෙටිකාලීන වෙන්කිරීම් | 26 | 2,502,590 | 1,314,590 |
| | | **131,675,899** | **157,701,768** |
| විලම්බිත ආදායම - විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය | 31 | **5,138,641** | **3,214,708** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 24 | 178,825,754 | 251,895,710 |
| විශේෂිත අරමුදල් (සීමිත) | 27 | 28,548,858 | 24,256,419 |
| | | **207,374,612** | **276,152,128** |
| **මුළු වගකීම්** | | **344,189,152** | **437,068,604** |
| **ශුද්ධ වත්කම්** | | **4,594,296,593** | **4,377,818,040** |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | | |
| වැය කල මූලධන ආධාර | | 2,309,443,686 | 2,173,635,578 |
| වැය නොවූ මූලධන ආධාර | 28 | (161,133,939) | (157,930,840) |
| මූල්‍ය නොවන රජයේ මූලධන ආධාර | | 290,741,388 | 314,046,649 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 29 | 2,149,157,473 | 2,149,157,473 |
| පරිත්‍යාග | 30 | 81,196,898 | 81,074,898 |
| සමුච්චිත අතිරික්තය/ (ඌනතාවය) | | (125,925,771) | (230,535,418) |
| සමුච්චිත අරමුදල- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය සඳහා | | 2,356,759 | 1,927,313 |
| අරමුදල සමුච්චිත- විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය | | 48,460,099 | 46,442,388 |
| **මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | **4,594,296,593** | **4,377,818,040** |

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (I) හා 107 (II) වගන්ති, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාරව සහ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) වලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කොට ඉදිරිපත් කර ඇත.

**ඩබ්ලියු.එම්.ඩබ්ලියු. වන්නිනායක (මූල්‍යාධිකාරී)** **බී.එම්. දයාවංශ (ලේඛකාධිකාරී)**

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පාලක සභාව වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශ පාලක සභාව විසින් අනුමත කරනු ලැබූ අතර පාලක සභාව වෙනුවෙන් 2022 පෙබරවාරි 24 දින අත්සන් කරන ලදී.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රෝහණ පී. මහලියනආරච්චි (උපකුලපති)**

**රන්ජිත් ලියනගේ (පාලක සභා සාමාජික)** **ටී. ධර්මරාජා (පාලක සභා සාමාජික)**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

## ස්කන්ධය හා ශුද්ධ වත්කම් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශනය

රු.

| | සමුච්චිත අතිරික්තය / (හිඟය) | පශ්චාත් උපාධි අරමුදල | විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ (CODL) අරමුදල | වැය වූ මූලධන ආධාර | වැය නොවූ මූලධන ආධාර | මූල්‍ය නොවන රජයේ ආධාර | පරිත්‍යාග | ප්‍රත්‍යාගණන අතිරික්තය / (ඌනතාවය) | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| **2020-01-01 දිනට ශේෂය (පෙර වාර්තා කරන ලද පරිදි)** | **(160,113,083)** | **2,729,832** | **41,643,122** | **2,055,584,137** | **(107,996,145)** | **327,471,194** | **80,694,897** | **2,149,157,473** | **4,389,171,428** |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| වර්ෂය තුළ වැය කරන ලද ප්‍රාග්ධන ප්‍රදානය | - | - | - | 306,934,700 | (306,934,700) | - | - | - | - |
| වර්ෂය තුළ වැය කරන ලද ප්‍රාග්ධන ප්‍රදානය (පුනරාවර්තන) | - | - | - | (10,851,803) | - | - | - | - | **(10,851,803)** |
| වර්ෂය තුළ ලැබුණු පරිත්‍යාග | - | - | - | - | - | 9,500,000 | 380,000 | - | **9,880,000** |
| වර්ෂය තුළ ලැබුණු අරමුදල් | - | (910,474) | (790,061) | - | 257,000,000 | - | - | - | **255,299,465** |
| ක්‍රමක්ෂය කිරීම | - | - | - | (177,308,947) | - | (22,924,545) | - | - | **(200,233,492)** |
| කාල සීමාව සඳහා අතිරික්තය /(හිඟය). | (70,422,335) | 107,955 | 5,589,326 | - | - | - | - | - | **(64,725,054)** |
| | | | | | | | | | |
| **2020-12-31 දිනට ශේෂය** | **(230,535,418)** | **1,927,313** | **46,442,388** | **2,173,635,578** | **(157,930,845)** | **314,046,649** | **81,074,897** | **2,149,157,473** | **4,378,540,543** |
| | | | | | | | | | |
| **2021-01-01 දිනට ශේෂය** | **(230,535,418)** | **1,927,313** | **46,442,388** | **2,173,635,578** | **(157,930,845)** | **314,046,649** | **81,074,897** | **2,149,157,473** | **4,377,818,034** |
| | | | | | | | | | |
| පෙර වර්ෂ සම්බන්ධයෙන් ගැලපුම් | 1,559,985 | - | - | - | - | - | - | - | **1,559,985** |
| වර්ෂය තුළ වැය කරන ලද ප්‍රාග්ධන ප්‍රදානය | - | - | - | 304,884,538 | (304,884,538) | - | - | - | - |
| වර්ෂය තුළ වැය කරන ලද ප්‍රාග්ධන ප්‍රදානය (පුනරාවර්තන) | - | - | - | (5,070,584) | - | - | - | - | **(5,070,584)** |
| වර්ෂය තුළ ලැබුණු පරිත්‍යාග | - | - | - | - | - | - | 122,000 | - | **122,000** |
| වර්ෂය තුළ ලැබුණු අරමුදල් | - | (20,200) | (488,338) | - | 301,681,442 | - | - | - | **301,172,905** |
| ක්‍රමක්ෂය කිරීම | - | - | - | (164,005,848) | - | (23,305,261) | - | - | **(187,311,108)** |
| කාල සීමාව සඳහා අතිරික්තය /(හිඟය). | 103,049,662 | 449,646 | 2,506,049 | - | - | - | - | - | **106,005,357** |
| | | | | | | | | | |
| **2021-12-31 දිනට ශේෂය** | **(125,925,771)** | **2,356,759** | **48,460,099** | **2,309,443,685** | **(161,133,941)** | **290,741,388** | **81,196,897** | **2,149,157,473** | **4,594,296,589** |

**The Accounting Policies on pages 08 to 13 and the Notes on pages 14 to 24 form an integral part of these Financial Statements.**

# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
## 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන් | රු. 2021 | රු. 2020 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහ** | | | |
| වර්ෂයේ මුළු අතිරික්තය / (ඌනතාවය) | | 106,005,357 | (64,725,054) |
| **මුල්‍ය නොවන ගැලපීම්** | | | |
| පෙර වසරවලට අදාළව ගැලපීම් | | 1,559,985 | - |
| ක්ෂය | | 187,269,094 | 200,109,302 |
| දේපළ පිරියත හා උපකරණ ඉවත්කිරීමෙන් වූ අලාභය | | - | 211,886 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය | | 42,014 | 124,190 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන | | (62,698,941) | 108,211,505 |
| **කාරක ප්‍රාග්ධන ගැලපීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් උත්පාදනය** | | **232,177,510** | **243,931,829** |
| **කාරක ප්‍රාග්ධන ගැලපුම්** | | | |
| තොග වැඩි වීම | | (3,001,153) | (160,074) |
| ලැබියයුත යුතු ශේෂයන්හි වැඩි වීම | | (1,339,592) | (740,300) |
| කෙටි කාලීන ආයෝජනයන්හි වැඩි වීම | | (2,940,634) | (3,451,213) |
| ඉදිරියට ගෙවීම්වල වැඩි වීම | | 366,118 | (833,155) |
| අත්තිකාරම්වල (වැඩි වීම) / අඩු වීම | | 49,830 | 561,762 |
| කාර්ය මණ්ඩල ණය මුදල්වල අඩු වීම | | (2,114,700) | 5,006,790 |
| බාහිර පාර්ශ්වයන්හි තැන්පතුවල අඩු වීම | | (131,887) | 200,000 |
| වෙනත් ගෙවිය යුතු දේහි වැඩි වීම/ (අඩු වීම) | | 11,045,318 | (18,679,058) |
| තැන්පතු හා රැඳවුම්වල වැඩි වීම/ (අඩු වීම) | | (16,409,527) | (3,801,259) |
| කෙටි කාලීන වෙන්කිරීමෙහි වැඩි වීම/ (අඩු වීම) | | 1,188,000 | (362,650) |
| උපචිත වියදම්වල වැඩි වීම/ (අඩු වීම) | | (21,849,660) | (22,326,185) |
| විලම්බිත ආදායමෙහි වැඩි වීම/ (අඩු වීම) | | **1,923,933** | **(59,080)** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන ලද ලද මුදල්** | | 198,963,557 | 199,287,407 |
| අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලසුම් පිරිවැය ගෙවා ඇත | | (10,371,015) | (21,395,367) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **188,592,542** | **177,892,040** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම | | (47,858,051) | (55,568,461) |
| අස්පෘශ්‍ය වත්කම් අත්පත්කර ගැනීම | | (3,727,189) | - |
| ප්‍රාග්ධන කෙරීගෙනයන වැඩ අත්පත්කර ගැනීම/මාරු කිරීම | | (213,494,671) | (185,997,336) |
| ආයෝජන | | 1,043,383 | (643,124) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **(264,036,527)** | **(242,208,921)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්** | | | |
| විශේෂිත අරමුදලේ වැඩි වීම | | 4,292,440 | 6,575,550 |
| මූලධන අරමුදල් ප්‍රදානයන්හි වැඩි වීම | | 132,605,011 | 68,116,746 |
| පරිත්‍යාගවල වැඩි වීම | | 122,000 | 380,000 |
| මූල්‍ය නොවන රජයේ ප්‍රදානයන්හි වැඩි වීම/ (අඩු වීම) | | (23,305,261) | (13,424,545) |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨ අරමුදලේ අඩු වීම | | (20,200) | (910,474) |
| විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ අරමුදලේ අඩු වීම | | (488,338) | (790,061) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන්** | | **113,205,653** | **59,947,215** |
| **මුදල් හා මුදල් මුදල් වලට සමානදේ හි ශුද්ධ වැඩිවීම/අඩු වීම** | | 37,761,667 | (4,369,666) |
| **වර්ෂය ආරම්භයේදී මුදල් හා මුදල් වලට සමාන දෑ** | 12 | 17,592,262 | 21961927.32 |
| **වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් වලට සමාන දෑ** | 12 | **55,353,929** | **17,592,262** |

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රකාශවලට සටහන්

**<u>03- දේපල වලින් lq කුලී</u>**

| | Rs. 2021 | Rs. 2020 |
|---|---|---|
| ජේ.ඒ.ඩී. පෙරේරා කලාගාරය | 98,560 | 285,900 |
| වෙනත් දේපල වලින් | 2,550,190 | 193,281 |
| **Akeöv** | **2,648,750** | **479,181** |

**04-08 පුනරාවර්තන වියදමෙහි සාරාංශය - 2021**

Rs.

සටහන : 4.01

| වැය විෂය ශීර්ෂය | වැඩසටහන 1 | වැඩසටහන 2 | වැඩසටහන 3 | වැඩසටහන 4 | වැඩසටහන 5 | වැඩසටහන 8 | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | **pÐp³ln** | **aQYyn kty\|eö** | **p\|s#ekºl _s#v\|** | **H^SY súbs³Qn** | **nde#eö** | **_n#v\|s^kºgºr** | |
| <u>පුද්ගල පඩිනඩි - අධ්‍යයන kºÒy ÒN#dly</u> | | | | | | | |
| 04101 වැටුප් හා වේතන | 20,830,382 | 166,717,277 | 5,008,085 | 827,804 | - | - | 193,383,547 |
| 04102 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල | 2,496,514 | 39,444,698 | 1,309,832 | 194,081 | - | - | 43,445,125 |
| 04103 විශ්‍රාම වැටුප | 1,731,933 | 20,349,996 | 696,875 | - | - | - | 22,778,804 |
| 04104 සේවk Bºrkºr අරමුදල | 845,689 | 11,958,858 | 401,341 | 38,816 | - | - | 13,244,705 |
| 04105 වැඩබැලීමේ දීමනාව | - | 126,000 | - | 79,416 | - | - | 205,416 |
| 04108 අධ්‍යයන දීමනාව | 10,546,850 | 207,239,975 | 7,995,703 | - | - | - | 225,782,527 |
| 04110 වෙනත් දීමනා | 168,087 | 1,462,800 | - | - | - | - | 1,630,887 |
| 04111 b\|h^r කරීකාවායර් ගාස්තුව | - | 7,987,204 | - | 542,250 | - | - | 8,529,454 |
| 04113 ජීවන වියදම් දීමනාව | 1,535,716 | 16,323,850 | 374,400 | 116,914 | - | - | 18,350,880 |
| 04116 20% දීමනාව (5%+15%) | 195,090 | (16,198) | - | - | - | - | 178,892 |
